# ලංකා තේ පර්යේෂණායතනය

# 1965

වසර සඳහා

# වාර්ෂික වාර්තාව

1 වෙනි කොටස

ඊ. එම්. වෙනරි
බී.එස්.සී., පී.එච්.ඩී. (ලන්ඩන්), ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී.

හා

ආර්. එල්. ද සිල්වා
බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්), ඩී.අයි.සී.

විසින් සම්පාදිතයි

පරිවර්තනය

සී. ඇම්. ප්‍රණාන්දු, බී.ඒ. (ලංකා)
විසිනි.

තලවාකැලේ, සාන්ත කුම්බස්හි ලංකා
තේ පර්යේෂණායතනය මගින් ප්‍රකාශිතයි

1967

# පටුන


| | පිටුව |
|---|---|
| මණ්ඩලය ... ... ... ... ... ... | 3 |
| කාර්ය මණ්ඩලය ... ... ... ... ... ... | 4 |
| 1965 වසර සඳහා ආයතන පාලක මණ්ඩලයේ හතලිස් වන වාර්ෂික වාර්තාව ... | 9 |
| 1965 මාර්තු 5 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව . ... | 18 |
| 1965 ජුනි 21 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව... ... | 24 |
| 1965 අගෝස්තු 23 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 28 |
| 1965 දෙසැම්බර් 13 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 31 |
| ඔඩිටර් ජෙනරාල් තුමාගේ වාර්තාව ... ... ... ... | 35 |
| තේ පර්යේෂණායතන මණ්ඩල සභාපති තුමාගේ වාර්තාව . ... ... | 36 |
| ෆේජාඩ් රෝඩ්ස් තෝන්ටන් සහ සමාගමේ වාර්තාව ... ... ... | 39 |
| ශේෂ පත්‍රය ... ... ... ... ... ... | 50 |
| කාරක ගිණුම—සාන්ත කුම්බ්ස් වතුයාය ... ... ... ... | 51 |
| කාරක ගිණුම—සාන්ත ජොයකිම් වතුයාය ... ... ... ... | 52 |
| 1965 සඳහා අය වැය ගිණුම ... ... ... ... ... | 53 |
| ස්ථාවර වත්කම් සාරාංශය ... ... ... ... ... | 54 |

# ලංකා තේ පර්යේෂණායතනය

## මණ්ඩලය

**(1965 ජනවාරි 1 වෙනි දිනට)**

**සභාපති:**

එෆ්. අමරසූරිය මහතා

**නිලබල සාමාජිකයෝ:**

**කෘෂිකර්ම අධ්‍යක්ෂක:**
ඩී. සී. එල්. අමරසිංහ මහතා

**ගරු මුදල් ඇමතිතුමා:**
ජී. ඩී. ලෝස් මහතා විසින් නියෝජනය කෙරේ.

**ලංකා වැවිලිකරු සංගමයේ සභාපති:**
ඩබ්ලිව්. ජේ. විල්ඩර්ස්ටන් මහතා

**ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයේ සභාපති:**
ජේ. එල්. කැපර් මහතා

**ලංකා පහත රට නිෂ්පාදක සංගමයේ සභාපති:**
ඩී. බී. එල්ලපොල මහතා, සී.බී.ඊ.

**තේ පාලක තැනා:**
සී. පී. වන්මුගම් මහතා

**ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක:**
ආචාර්ය ඊ. එම්. වෙනරි

**පත්කළ සාමාජිකයෝ:**

**ලංකා වැවිලිකරු සංගමය මගින් පත් කළ අය:**
එස්. පී. වෛතිලිංගම් මහතා
ජී. බී. මිඩ්ල්ටන් මහතා
ඒ. පී. ෆින්වර් මහතා

**ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය මගින් පත් කළ අය:**
එච්. ඒ. විටෝල් මහතා
ඩී. ඒ. නීල් මහතා
පී. ජේ. සී. ඩරන්ට් මහතා

**ලංකා පහත රට නිෂ්පාදක සංගමය මගින් පත් කළ අය:**
එෆ්. අමරසූරිය මහතා
එස්. පත්මනාදන් මහතා
ජේ. එල්. ඩී. පීරිස් මහතා

**සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා ගරු කෘෂිකර්ම ඇමතිවරයා පත් කළ අය:**
ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා
එම්. රාජේන්ද්‍රම් මහතා, එම්.බී.ඊ.

**නියෝජිත මන්ත්‍රී මණ්ඩලය නියෝජනය සඳහා ගරු කෘෂිකර්ම ඇමතිවරයා පත් කළ අය:**
හිස්

**ලේකම්:** ඒ. සී. පෙරේරා මහතා

# ලංකා තේ පර්යේෂණායතනය

## කාර්ය මණ්ඩලය*

---

### අධ්‍යක්ෂක මණ්ඩලය

**අධ්‍යක්ෂක** ... ... ... ආ. එම්. වෙනරි, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්), ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී.

**නියෝජ්‍ය අධ්‍යක්ෂක** ... ... ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට්, බී.එස්.සී. (රෙඩිං)

**සහකාර අධ්‍යක්ෂක** ... ... එල්. එච්. ප්‍රණාන්දු, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්)

### පර්යේෂණ අංශයෝ

**කෘෂිකර්ම රසායන විද්‍යාව:**

**කෘෂිකර්ම රසායනඥ** ... ... ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට්, බී.එස්.සී. (රෙඩිං)

**පර්යේෂණ සහයකයෝ** ... †ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. බී. මනිපුර, බී.එස්.සී. (ලංකා)
එස්. සන්දනම්, බී.එස්.සී. (ලංකා)
එස්. සිවසුබ්‍රමානියම්, බී.එස්.සී. (ලංකා)

**කර්මාන්තඥ සහයකයෝ** ... බී. අයි. ද සිල්වා මහත්මිය, බී.එස්.සී. (ලංකා)
ටී. සී. ඉසෙඩ්. ජේමන්
ටී. කුලරත්න, බී.එස්.සී. (ලංකා)
වී. මෙන්දිස්
එම්. සිකුරාජපති, බී.එස්.සී. (ලංකා)
කේ. සිවලිංගම්, බී.එස්.සී. (ලංකා)
ඒ. සෝමරත්න, බී.එස්.සී. (ලංකා)
එස්. සුන්දරලිංගම්, බී.එස්.සී. (පූනා)

**ජෛව රසායන විද්‍යාව:**

**ජෛව රසායනඥ** ... ... ජී. ඩබ්ලිව්. සැන්ඩර්සන්, බී.එස්.සී. (කැලිපෝනියා), පී.එච්.ඩී. (නොටිංහැම්)

**ජෛව රසායනඥ (නිෂ්පාදන)** ... ආර්. එල්. වික්‍රමසිංහ, බී.එස්.සී. (ලංකා), බී.එස්.සී. (ලංඩන්), පී.එච්.ඩී. (ෂෙපීල්ඩ්), එෆ්.ආර්.අයි.සී.

**පර්යේෂණ නිලධාරි** ... ... ඒ. එස්. එල්. තිරිමාන්න, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්)

**පර්යේෂණ සහයකයෝ** ... ජී. ආර්. රොබර්ට්ස්, බී.එස්.සී. (ලංකා), ඒ.ආර්.අයි.සී.
†ආර්. ආර්. සෙල්වේන්ද්‍රන්, බී.එස්.සී. (ලංකා)

**කර්මාන්තඥ සහයකයෝ** ... වී. ප්‍රණාන්දු
බී. පී. එම්. පෙරේරා
කේ. පී. ඩබ්ලිව්. සී. පෙරේරා, බී.එස්.සී. (ලංකා)
වී. එච්. පෙරේරා, බී.එස්.සී. (ලංකා)
කේ. සිවපාලන්, බී.එස්.සී. (ලංකා)

---

† එතෙර පුහුණුව

## කෘමි විද්‍යාව:

කෘමි විද්‍යාඥ ... ... ... ජේ. ඊ. බ්‍රැනම්, බී.ඒ. (කේම්බ්‍රිජ්), ඩී.අයි.සී.

පර්යේෂණ නිලධාරිහු ... ... ඩී. කාල්නයිද්ද, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්)
ඩබ්ලිව්. දන්තනාරායන, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්), ඩී.අයි.සී.

පර්යේෂණ සහයක ... ... ඩී. ජේ. ඩබ්ලිව්. රණවීර

කර්මාන්තඥ සහයකයෝ ... ඊ. එෆ්. ඩබ්ලිව්. ප්‍රනාන්දු, බී.එස්.සී. (ලංකා)
ඒ. කතිරවෙට්පිල්ලෙයි, බී.එස්.සී. (ලංකා)
සී. ෂන්මුගම්

## කීට විද්‍යාව:

උපදේශක ... ... ... ඒ. ක්කර්, බී.එස්.සී. (එඩින්), පී.එච්.ඩී. (ඇඩිලේඩ්)

වැඩ බලන කීට විද්‍යාඥ ... ... එන්. ෂන්මුගනාදන්, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්).

පර්යේෂණ නිලධාරි ... ... පී. සිවපාලන්, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (රට්ගර්ස්)

කර්මාන්තඥ සහයකයෝ ... ඒ. ආර්. එම්. හසීම්
පී. ඒ. ජෝන්
ටී. මනිවාසගර්
එස්. සමරජීව
එම්. කේ. වෛතිලිංගම්

## පැළෑටි ව්‍යාධි විද්‍යාව:

උපදේශක ... ... ... ඒ. ක්කර්, බී.එස්.සී. (එඩින්), පී.එච්.ඩී. (ඇඩිලේඩ්)

පැළෑටි ව්‍යාධි විද්‍යාඥ ... ... එන්. ෂන්මුගනාදන්, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්)

පර්යේෂණ නිලධාරි ... ... ආර්. ඇල්. ද සිල්වා, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්), ඩී.අයි.සී.

කර්මාන්තඥ සහයකයෝ ... පී. වී. අරුල්ප්‍රගාසම්, බී.එස්.සී. (මද්‍රාසි)
එස්. ආර්. ඒ. ප්‍රනාන්දු, බී.එස්.සී. (ලංකා)
එස්. මුරුගයියා
ඩබ්ලිව්. ආර්. එෆ්. රුද්‍රිගු, බී.එස්.සී. (ලංකා)

## පැළෑටි කායික විද්‍යාව:

පැළෑටි කායික විද්‍යාඥ ... ... යූ. පෙතියාගොඩ, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී (ලන්ඩන්), ඩී.අයි.සී.

පර්යේෂණ සහයකයෝ ... එස්. කන්දයියා, බී.එස්.සී. (ලංකා)
එස්. නාගරාජා, බී.එස්.සී. (ලංකා), එම්.එස්.සී. (කැලිපෝනියා)

කර්මාන්තඥ සහයකයෝ ... එස්. ක්‍රිෂ්ණපිල්ලේ, බී.එස්.සී. (ලංකා)
එම්. පියසේන
ජී. එම්. එච්. බී. විජේතුංග

---

† එතෙර පුහුණුව

## වර්ධක ප්‍රචාරණය:

උපදේශක ... ... ... ඒ. ඩී. රිචර්ඩ්ස්, බී.එස්.සී. (ලන්ඩන්), එම්.එස්.සී. (කැලිෆෝනියා), කෘෂිකර්ම ඩිප්ලෝමා (කේම්බ්‍රිජ්), ඒ.සී.අයි.ටී.ඒ. (ට්‍රිනිඩෑඩ්)

පර්යේෂණ සහයකයෝ ... †වී. එස්. කුලසේකරම්, බී.එස්.සී. (ලංකා)
†ඒ. ආර්. සෙබස්තියන්පිල්ලේ, බී.එස්.සී. (ලංකා)

කර්මාන්තඥ සහයකයෝ ... ඒ. එම්. අබේසිංහ
ඒ. එස්. බී. ගෝමස්, බී.එස්.සී. (ලංකා)
ඩී. ජානකීරාම්, බී.එස්.සී. (මද්‍රාසි)
එච්. බී. රත්නායක
එච්. ආර්. සොලමන්

## සංඛ්‍යාති:

සංඛ්‍යා ලේඛනඥ ... ... පී. කනපතිපිල්ලේ, බී.එස්.සී. (ලන්ඩන්), එෆ්.එස්.එස්.

කර්මාන්තඥ සහයක ... ... කේ. සිවරත්නම්

## කර්මාන්ත ශිල්පය:

කර්මාන්ත ශිල්පඥ ... ... ඩී. කීර්තිසිංහ, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්), ඩී.අයි.සී.

තේ රසාඥ ... ... ... සී. එච්. වික්‍රමසිංහ

පර්යේෂණ සහයක ... ... ඩබ්ලිව්. ජෝශප්, බී.එස්.සී. (ලංකා)

කර්මාන්තඥ සහයකයෝ ... ඩබ්ලිව්. සී. ඒ. ද සිල්වා, බී.එස්.සී. (ලංකා)
සී. කන්දප්පා, බී.එස්.සී. (ලංකා)
ටී. ඒ. මුණසිංහ
ටී. එෆ්. සල්දීන්, බී.එස්.සී. (ලංකා)
එස්. සමරසිංහම්
එම්. ටී. සුබ්‍රමානියම්, බී.එස්.සී. (ලංකා)

## පහතරට සේවය:

සහකාර අධ්‍යක්ෂක ... ... එල්. එච්. ප්‍රණාන්දු, බී.එස්.සී. පී.එච්.ඩී. (ලන්ඩන්)

## පහතරට ස්ථානය රත්නපුර:

ප්‍රාදේශීය උපදෙස් නිලධාරි ... ජේ. වී. සබානායගම්, බී.එස්.ඒ. (ටොරොන්ටෝ)

කර්මාන්තඥ සහයකයෝ ... ජේ. අයි. එච්. බණ්ඩාරනායක
එච්. ඩී. ජයසිංහ
ඩී. ඩී. කෘෂන්
එන්. එස්. රාජේන්ද්‍රම්, බී.එස්.සී. (මද්‍රාසි)
එච්. එච්. සමරකෝන්
යූ. පී. ද එස්. වෛද්‍යනාත, බී.එස්.සී. (ලංකා)
එන්. යෝගරත්නම්, බී.එස්.සී. (අලහබාඩ්)

---

† එතෙර පුහුණුව

| | | |
|---|---|---|
| **ප්‍රධාන ලිපිකරු** | ... ... | ආර්. අයි. පෙරේරා |
| **ලඝුහන් කරු** | ... ... | එස්. කේ. පී. තම්බිමුත්තු |
| **ගණක ලිපිකරු** | ... ... | කේ. පී. ගුණවර්ධන |
| **විදුලි වැඩකරු** | ... ... | බී. ටී. රණසිංහ |

## තල්ගම්පොළ, කොට්ටාව අතුරු ස්ථානය:

| | | |
|---|---|---|
| **කාර්ය බාර නිලධාරි** | ... ... | කේ. එච්. ජී. ගුණපාල |

## උපදෙස් සේවය

| | | |
|---|---|---|
| **ප්‍රධාන උපදෙස් නිලධාරි** | ... ... | සී. බී. පොස්ටර් බාරම්, එම්.ඒ. (කේම්බ්‍රිජ්) |
| **පර්යේෂණ සහයකයෝ** | ... | †ඩී. ටී. වෙත්තසිංහ, බී.එස්.සී. (ලංකා)<br>ආර්. කේ. නැතැනියෙල් බී.එස්.සී. (පූනා) |

## ප්‍රාදේශීය උපදෙස් නිලධාරීහු:

| | | |
|---|---|---|
| **ඌව** | ... ... ... | එල්. එම්. ද ඩබ්ලිව්. තිලකරත්න, බී.එස්.සී. (ලංකා), එම්.ඊඩී (කැලිපෝනියා) |
| **පහත රට** | ... ... ... | ජේ. වී. සබානායගම්, බී.එස්.සී. (ටොරොන්ටෝ) |
| **කර්මාන්තඥ සහයක (ඌව)** | ... | ඩී. එන්. ආර්. විජේවර්ධන |
| **ඡායාරූප ශිල්පි** | ... ... | ඩී. ජේ. එම්. හෙට්ටිආරච්චි |
| **ලිපිකරු** | ... ... ... | කේ. එල්. ද අල්විස් |

## පුස්තකාලය හා ප්‍රකාශන

| | | |
|---|---|---|
| **ප්‍රකාශන සම්පාදකයෝ** | ... ... | ඊ. එම්. වෙනරි,බී.එස්.සී., පී.එච්.ඩී.(ලන්ඩන්) ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී.<br>ආර්. එල්. ද සිල්වා, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්), ඩී.අයි.සී. |
| **පුස්තකාලයාධිපති** | ... ... | ඩී. ජේ. එස්. ද සිල්වා, බී.එස්.සී. (පන්ජාබ්) |

## වතුයාය

### සාන්ත කූම්බ්ස්:

| | | |
|---|---|---|
| **කෘෂිකර්මාන්තඥ** | ... ... | එල්. ඒ. සිවරත්නම්, බී.එස්.සී. (ඩුනෙම්) |
| **ප්‍රධාන කම්හල් නිලධාරි** | ... | වී. ඒ. ෆිනැන්ඩස් |
| **මුල් ලිපිකරු** | ... ... | පී. ඊ. ද සිල්වා |
| **ඇපොතිකරි** | ... ... ... | එස්. පී. ද සිල්වා |

† එතෙර පුහුණුව

**සාන්ත ජොයකිම්:**

| | |
|---|---|
| අධිකාරි ... ... ... | ජී. එස්. මුත්තෙට්ටුවෙගම |
| ප්‍රධාන කම්හල් නිලධාරි ... | එම්. එස්. ඩබ්ලිව්. විජේරත්න |
| මුල් ලිපිකරු . ... ... | ජී. එල්. ඒ. තෝමස් |

## පරිපාලනය

| | |
|---|---|
| වැඩ බලන ප්‍රධාන පරිපාලක නිලධාරි... | ඒ. සී. පෙරේරා |
| සහකාර පරිපාලක නිලධාරි . ... | එස්. ත්‍යාගරාජා |
| අධ්‍යක්ෂකගේ ලේකම් (වැඩ බලන) ... | ජී. ඒ. එස්. ගුණසිංහ |
| පරිවර්තක/උපදේශක ... ... | සී. ඇම්. ප්‍රනාන්දු, බී.ඒ. (ලංකා) |

**ගණක අංශය:**

| | |
|---|---|
| ගණකාධිකාරි ... ... ... | හිස් |
| ගණක සහයක ... ... ... | ඒ. එච්. බී. ඩයස් |
| සහකාර ලේකම් ... ... | සී. කීර්තිරත්න, එජ්.සී.සී.එස්. |
| ගණක ලිපිකරුවෝ ... ... | කේ. ඩී. බී. එච්. අබේගුණවර්ධන<br>එච්. අත්තනායක<br>ජී. ඒ. කේ. පී . ද සිල්වා<br>එන්. එම්. ජයතිලක<br>එස්. කුලසබනාදන්<br>එම්. බී. පැලිස්<br>ටී. ආර්. බී. සලේ<br>ඩබ්ලිව්. ජේ. සැමුවෙල්<br>එන්. සච්තානන්දන් |

**යතුරු ලියන අංශය:**

| | |
|---|---|
| ලඝුහන් කරුවෝ ... ... | †එජ්. ජී. ද සිල්ව්<br>එස්. ඒ. එල්. එච්. ප්‍රනාන්දු<br>පී. ඩබ්ලිව්. උඩුවාවල<br>එස්. ඩී. ජේ. ජේ. විතාරණපතිරණ |
| ලිපිකරු/යතුරු ලියන්නෝ ... | ජේ. එන්. ඇපාසිංහ<br>ඩී. ඩබ්ලිව්. බර්තොලොමියුස්<br>වී. කෝද්දගොඩ<br>එස්. බී. වැත්තෑව |

**කාර්මික අංශය:**

| | |
|---|---|
| වෙළෙඳ කළමනාකරු . ... | ඕ. ජේ. ප්‍රනාන්දු |
| විදුලිබල ෆෝර්මන් ... ... | ඩබ්ලිව්. ආර්. සොලමොන් |
| වැඩ ලිපිකරු... ... ... | ආර්. ඒ. ඩැනියෙල් |
| ගබඩාකරු ... ... ... | අයි. පී. දිසානායක |
| මිකැනික්වරු... ... ... | ඩී. ඒ. එස්. ඕපාත<br>කේ. එස්. වඩිවේලු |
| විදුලි වැඩකරු ... ... | ඩබ්ලිව්. සී. ඒ. ද සිල්වා |

* තනතුරක් යටතේ නම් කිහිපයක් එන විට ඉංග්‍රීසි හෝඩියේ අකුරු අනුපිළිවෙලට නම් දක්වේ.

† එතෙර පුහුණුව

# 1965 වසර සඳහා ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ හතලිස්වන වාර්ෂික වාර්තාව

---

## පිහිටුවීම

ලංකා තේ පර්යේෂණායතනය 1925 ඔක්තෝබර් 27 දතම 1925 අංක 12 දරණ ආඥා පනතින් ස්ථාපනය කරන ලදි.

## ව්‍යවස්ථාව

පාලක මණ්ඩලයේ සැදීම ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්තියෙහි (1956 සංශෝධන) 438 පරිච්ඡේදයෙහිත් පහත දැක්වෙන තේ පර්යේෂණ (සංශෝධිත) පනත්වලත් දැක් වේ.

1957 මාර්තු 18 දතම 1957 අංක 8
1959 ජනවාරි 21 දතම 1959 අංක 2
1959 ජනවාරි 21 දතම 1959 අංක 3
1961 ජූනි 19 දතම 1961 අංක 57

සංශෝධිත පනත්වල අංක යෙදීම 1956 සංශෝධිත ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්තියෙහි අංකයන් හා නොගැලපෙන හෙයින් ඒකාබද්ධ කිරීමක් දැන් අවශ්‍ය ය.

### මණ්ඩලයේ හා කමිටුවල සාමාජිකත්වය

## මණ්ඩලය

1965 ජනවාරි 1 වෙනි දිනට මණ්ඩලයේ සාමාජිකයෝ

**සභාපති:**

එෆ්. අමරසූරිය මහතා

**නිලබල සාමාජිකයෝ:**

**කෘෂිකර්ම අධ්‍යක්ෂක:**
ඒ. ටී. එම්. සිල්වා මහතා

**ගරු මුදල් ඇමති වෙනුවෙන්:**
ජී. ඩී. ලෝස් මහතා

**සභාපති, ලංකා වැවිලිකරු සංගමය:**
ඩබ්ලිව්. ජේ. විල්ඩර්සන් මහතා

**සභාපති, ඒජංසි අංශය, ලංකා වැවිලිකරු සංගමය:**
ජේ. එල්. කැපර් මහතා

**සභාපති, ලංකා පහත රට නිෂ්පාදන සංගමය:**
පී. නඩේසන් මහතා, සී.එම්.ජී., ඕ.බී.ඊ.

**තේ පාලක:**
සී. පී. චන්මුගම් මහතා

**අධ්‍යක්ෂක, ලංකා තේ පර්යේෂණායතනය:**
ආචාර්ය ඊ. එම්. වෙනරි

**පත් කළ සාමාජිකයෝ:**

**ලංකා වැවිලිකරු සංගමයෙන් පත් කළ අය:**

එස්. පී. වෛතිලිංගම් මහතා
ඩබ්ලිව්. ටී. විලියම්ස් මහතා
ජී. බී. මිඩල්ටන් මහතා

**ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයෙන් පත් කළ අය:**

පී. ජේ. සී. ඩරන්ට් මහතා
එච්. ඒ. විටෝල් මහතා
ඩී. ඒ. නීල් මහතා

**පහත රට නිෂ්පාදන සංගමයෙන් පත් කළ අය:**

එෆ්. අමරසූරිය මහතා
එස්. පත්මනාදන් මහතා
ජේ. එල්. ඩී. පීරිස් මහතා

**සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා ගරු කෘෂිකර්ම ඇමතිවරයා පත් කළ අය:**

ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, ස.වි.
එම්. රාජේන්ද්‍රම් මහතා, එම්.බී.ඊ., ස.වි.

**නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගරු කෘෂිකර්ම ඇමතිතුමා පත් කළ අය:**

හිස්

**ලේකම්:** ජී. එම්. ස්පාර්ක්ස් මහතා

**නීතිපතිහු:** ජුලියස් සහ ක්‍රිසි සමාගම

**ගණන් පරීක්ෂකවරු:** ෆෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම

වර්ෂය තුළ මණ්ඩලයේ සාමාජිකත්වය පිළිබඳ පහත සඳහන් වෙනස්වීම් වාර්තා කරනු ලැබී ය:

ජුනි 2 වෙනි ද සිට ඒ. ටී. එම්. සිල්වා මහතා වෙනුවට ඩී. සී. එල්. අමරසිංහ මහතා අනුප්‍රාප්ත විය.

මාර්තු 27 වෙනිද සිට පී. නඩේසන් මහතා වෙනුවට ඩී. බී. එල්ලපොල මහතා අනුප්‍රාප්ත විය.

සැප්තැම්බර් 1 වෙනිද සිට ඩබ්ලිව්. ටී. විලියම්ස් මහතා වෙනුවට ඒ. පී. පින්වර් මහතා අනුප්‍රාප්ත විය.

සැප්තැම්බර් 21 වෙනිද සිට ඩී. ඒ. නීල් මහතා නිවාඩු පිට සිටි කාලයේ දී ඔහු වෙනුවට ඒ. ජී. සාප්පෝල් මහතා වැඩ බැලී ය.

ජුනි 16 වෙනිද සිට අවුරුදු 3 ක කාලයකට මහජන මන්ත්‍රී ඩී. ජේ. රණවීර මහතා පත් කරන ලදී.

ඔක්තෝබර් පළමුවෙනිද සිට ලේකම් වශයෙන් ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා වෙනුවට ඒ. සී. පෙරේරා මහතා අනුප්‍රාප්ත විය.

**රැස්වීම්**

මාර්තු 5, ජුනි 21, අගෝස්තු 23, සැප්තැම්බර් 29 හා දෙසැම්බර් 13 යන දිනවල මණ්ඩල රැස්වීම් පහක් පවත්වන ලදී.

## පරිපාලන කමිටුව

ජනවාරි 1 වෙනිද පරිපාලන කමිටුවේ සාමාජිකයෝ:

**සභාපති**

**ලංකා තේ පර්යේෂණායතනයේ සභාපති:**
එෆ්ජ්. අමරසූරිය මහතා

**සාමාජිකයෝ:**

**ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක:**
ආචාර්ය ඊ. ඇම්. වෙනරි

ජේ. එල්. කැපර් මහතා
ඩබ්ලිව්. ජේ. විල්ඩයන් මහතා
ඩී. ඒ. නීල් මහතා
සී. පී. චන්මුගම් මහතා
ජී. ඩී. ලෝස් මහතා
එස්. පත්මනාදන් මහතා

**ලේකම්:**

**ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ ලේකම්:**
ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා

වසර තුළ සාමාජිකත්වය පිළිබඳ පහත සඳහන් වෙනස් වීම් ඇති විය:

අගෝස්තු 23 වෙනිද ඩී. බී. එල්ලපොල මහතා කමිටුවට පත් කරන ලදී.

ඔක්තෝබර් 1 වෙනිද සිට ලේකම් වශයෙන් ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා වෙනුවට ඒ. සී. පෙරේරා මහතා අනුප්‍රාප්ත විය.

**රැස්වීම්:**

පෙබරවාරි 12, මාර්තු 4, මැයි 28, නොවැම්බර් 12 හා දෙසැම්බර් 21 යන දිනයන්හි කමිටු රැස්වීම් පහක් පවත්වන ලදී.

**අත්හද බැලීම් හා වතුයා කමිටුව:**

ජනවාරි පළමුවෙනි දින අත්හද බැලීම් හා වතුයාය කමිටුවේ සාමාජිකයෝ:

**සභාපති:**

**ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක:**

ආචාර්ය ඊ. ඇම්. වෙනරි

**නිලබල සාමාජිකයෝ:**

**ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති:**

එෆ්. අමරසූරිය මහතා

**ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ සභාපති:**

ඩබ්ලිව්. විල්ඩසන් මහතා

**ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ ඒජන්සි අංශයේ සභාපති:**

ජේ. එල්. කැපර් මහතා

**සාන්ත කුම්බස් වතුයායේ වීක්ෂණ නියෝජිත:**

පී. ආර්. යූ. ඊස්ට්ල් මහතා

**සාන්ත ජෝයකිම් වතුයායේ වීක්ෂණ නියෝජිත:**

ජේ. ඩබ්ලිව්. ක්‍රෙග් මහතා

**තේ පර්යේෂණායතනයේ දෙවු නිලධාරීහු:**

**පත්කළ සමාජිකයෝ:**

**තේ පර්යේෂණායතනයේ විද්‍යා කමිටුව නියෝජනය කරන අය**

එස්. පී. වෛතිලිංගම් මහතා
එච්. ඒ. විටෝල් මහතා
ඒ. පී. පින්වර් මහතා

**දිස්ත්‍රික්ක වැවිලිකරු සංගම් නියෝජනය කරන අය:**

| | | |
|---|---|---|
| බදුල්ල | — | ආර්. එල්. හාවි මහතා |
| බණ්ඩාරවෙල | — | පී. ජී. උග්ලෝ මහතා |
| දික්ඔය | — | ඒ. මැකී මහතා |
| දිඹුල | — | පී. සී. ඉන්ස් මහතා |
| මහනුවර | — | සී .විජේනායක මහතා |
| කැළණිවැලි | — | ආර්. සී. එම්. ප්‍රයිස් මහතා |
| නුවර එළිය | — | ආර්. කේ. ක්‍රිස්ටි මහතා |
| සබරගමුව | — | එච්. ඩී. රොස් මහතා |
| දකුණු පළාත | — | ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා |

**ලංකා වැවිලිකරු සංගමයේ ඒජන්සි අංශය නියෝජනය කරන අය:**

පී. ජේ. සී. ඩරන්ට් මහතා

**තේ වෙළඳ අංශය:**

ඒ. ඩී. නීල් මහතා

**කැඳවන්නා/ලේකම්:**

ආචාර්ය එන්. ෂන්මුගනාදන්

වසර තුළ සාමාජිකත්වය පිළිබඳ පහත සඳහන් වෙනස් වීම් ඇති විය.

සැප්තැම්බර් 11 වෙනි ද සිට ඩබ්ලිව්. ටී. විලියම්ස් මහතා වෙනුවට ඒ. පී. පින්චර් මහතා අනුප්‍රාප්ත විය.

**රැස්වීම:**

පෙබරවාරි 20, මැයි 8 සහ ඔක්තෝබර් 2 යන දිනයන්හි කමිටුව රැස්වීම තුනක් පැවැත්වූවා ය.

## පත්වීම් කමිටුව

ජනවාරි පළමුවැනි ද පත්වීම් කමිටුවේ සාමාජිකයෝ.

**සභාපති**

**තේ පර්යේෂණායතන මණ්ඩල සභාපති:**

එෆ්ජ්. අමරසූරිය මහතා

**සාමාජිකයෝ:**

**තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක:**

ආචාර්ය ටී. ඇම්. වෙනරි

සී. පී. චන්මුගම් මහතා

ඩී. ඒ. නීල් මහතා

ඩී. ටී. හෙට්ටිආරච්චි මහතා

ඩබ්ලිව්. ටී. විලියම්ස් මහතා

**ලේකම්:**

**තේ පර්යේෂණායතන මණ්ඩල ලේකම්:**

ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා

වසර තුළ පහත සඳහන් වෙනස්වීම් ඇති විය.

සැප්තැම්බර් 29 වෙනි ද සිට ඩබ්ලිව්. ටී. විලියම්ස් මහතා වෙනුවට ඩී. බී. එල්ලපොල මහතා අනුප්‍රාප්ත විය.

ඔක්තෝබර් 1 වෙනිද සිට ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා වෙනුවට ඒ. සී. පෙරේරා මහතා අනුප්‍රාප්ත විය.

**රැස්වීම:**

මාර්තු 4 වෙනිද කමිටු රැස්වීමක් පවත්වන ලදී.

## ගොඩනැගිලි කමිටුව:

**සභාපති:**

එස්. පී. වෛතිලිංගම් මහතා

**සාමාජිකයෝ:**

**තේ පර්යේෂණායතනයේ සභාපති:**

එෆ්ජ්. අමරසූරිය මහතා

**තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක:**

ආචාර්ය ටී. ඇම්. වෙනරි

ජී. බී. මිඩ්ල්ටන් මහතා

ජේ. එල්. ඩී. පීරිස් මහතා

**ලේකම්:**

**තේ පර්යේෂණායතන මණ්ඩලයේ ලේකම්:**

ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා

වසර තුළ පහත සඳහන් වෙනස්වීම් ඇති විය.

ඔක්තෝබර් 1 වෙනිද සිට ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා වෙනුවට ඒ. සී. පෙරේරා මහතා අනුප්‍රාප්ත විය.

**රැස්වීම්:**

ජනවාරි 22, ජුනි 7 හා නොවැම්බර් 4 යන දිනයන්හි දී කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදි.

## පහත රට ස්ථාන කමිටුව:

**ජනවාරි 1 වෙනි දිනට කමිටුවේ සාමාජිකයෝ:**

**සභාපති:**

**තේ පර්යේෂණායතන මණ්ඩල සභාපති:**

එෆ්ජ්. අමරසූරිය මහතා

**සාමාජිකයෝ:**

**තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක:**

ආචාර්ය ර්. ඇම්. වෙනර්

**සාන්ත ජෝයකිම් වතුයාය වීක්ෂණ නියෝජිත:**

ජේ. ඩබ්ලිව්. ක්‍රෙග් මහතා

**තේ පර්යේෂණායතනයේ ප්‍රධාන පරිපාලක නිලධාරි:**

ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා

ඩී. ර්. හෙට්ටිආරච්චි මහතා — ජේ. එල්. ඩී. පීරිස් මහතා

එස්. පී. වෛතිලිංගම් මහතා

**යොදගත් සාමාජිකයෝ:**

ආර්. ඒ. ජී. මැක්මිචන් මහතා — එම්. රාජේන්ද්‍රම් මහතා

වී. ජී. ඩබ්ලිව්. රත්නායක මහතා — එච්. ඩී. රොස් මහතා

**ලේකම්:**

**තේ පර්යේෂණායතන පහතරට ස්ථාන විද්‍යා නිලධාරි**

ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු

වසරතුළ සාමාජිකත්වය පිළිබඳ පහත සඳහන් වෙනස්වීම් ඇති විය.

අගෝස්තු 23 වෙනිද, පහතරට නිෂ්පාදක සංගමයේ සභාපති ඩී. බී. එල්ලපොල මහතා මණ්ඩලය විසින් පත් කරන ලදි.

ඔක්තෝබර් 1 වෙනිද සිට ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා වෙනුවට ලේකම් වශයෙන් ඒ. සී. පෙරේරා මහතා අනුප්‍රාප්ත විය.

**රැස්වීම්:**

පෙබරවාරි 13, මැයි 27 හා සැප්තැම්බර් 29 යන දිනයන්හි දී කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදි.

## විද්‍යා කමිටුව

ජනවාරි 1 වෙනි දින කමිටුවේ සාමාජිකයෝ

**සභාපති:**

**තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක:**

ආචාර්ය ර්. ඇම්. වෙනර්

**සාමාජිකයෝ:**

**තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති:**

එෆ්. අමරසූරිය මහතා
ඒ. පී. පින්වර් මහතා
එස්. පී. වෛතිලිංගම් මහතා
එච්. ඒ. විටෝල් මහතා

**ලේකම්:**

**තේ පර්යේෂණායතන මණ්ඩලයේ ලේකම්:**

ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා

වසර තුළ පහත සඳහන් වෙනස්වීම් ඇති විය.

අගෝස්තු 29 වෙනිද සිට ඩබ්ලිව්. ටී. විලියම්ස් මහතා වෙනුවට ඒ. පී. පින්වර් මහතා අනුප්‍රාප්ත විය.

ඔක්තෝබර් පළමු වෙනිද සිට ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා වෙනුවට ඒ. සී. පෙරේරා මහතා අනුප්‍රාප්ත විය.

**රැස්වීම්:**

පෙබරවාරි 19 වෙනිද කමිටුවේ රැස්වීමක් පැවැත්විණ.

## එක්සත් රාජධානියේ විද්‍යාත්මක උපදෙස් කමිටුව

ජනවාරි පළමුවෙනි දින කමිටුවේ සාමාජිකයෝ

**සභාපති:**

එෆ්. ආර්. ටබ්ස්, සී.බී.ඊ., එම්.ඒ., පී.එච්.ඩී., ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී.
**නැගෙනහිර මෝලිං අත්හද බැලීම් ස්ථානයේ අධ්‍යක්ෂක:**

**සාමාජිකයෝ:**

එෆ්. සී. බෝඩන්, එම්.ඒ., එෆ්.ආර්.එස්.

ටී. ඒ. බෙනට් ක්ලාක්, එම්.ඒ.,පී.එච්.ඩී., එෆ්.ආර්.එස්., **ජෛව විද්‍යාව පිළිබඳ මහාචාර්ය හා නෝර්විච්හි නැගෙනහිර ඇංග්ලියා විශ්ව විද්‍යාලයේ ජෛව විද්‍යාත්මක පීඨයේ විනෝතෘ.**

ජී. ඊ. බ්ලැක්මන්, එම්.ඒ., එෆ්.ආර්.එස්., **ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයේ ග්‍රාමීය ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය;** හා
ලංඩනයේ ලංකා සංගමයේ සාමාජිකයෙක්.

**කැඳවන්නා:**

**එෆ්. ආර්. ටබ්ස්, සී.බී.ඊ.**, එම්.ඒ., පී.එච්.ඩී., ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී.

වෙනස්වීම් නොමැති විය.

## තේ පර්යේෂණායතන කණිටු නිලධාරි වෛද්‍ය අරමුදල් පාලක කමිටුව:

ජනවාරි පළමුවෙනි දින පාලක කමිටුවේ සාමාජිකයෝ

තේ.පර්.ආ. සභාපති (එෆ්. අමරසූරිය), ඩබ්ලිව්. ජේ. සැමුවෙල් මහතා, තේ.පර්. ආ. අධ්‍යක්ෂක (ආචාර්ය ඊ. ඇම්. වෙනරි)

## තේ පර්යේෂණායතන නිලධාරි අර්ථසාධක අරමුදල් භාරකරුවෝ:

**භාරකරුවෝ:**

තේ. පර්. ආ. සභාපති (එෆ්. අමරසූරිය මහතා), ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, ජේ. එල්. කැපර් මහතා, එම්. කේ. වෛතිලිංගම් මහතා සහ තේ. පර්. ආ. අධ්‍යක්ෂක (ආචාර්ය ඊ. ඇම්. වෙනරි)

## වීක්ෂණ නියෝජිතයෝ:

පී. ආර්. යූ. ස්ටීල් මහතා අප්‍රේල් 23, ජුලි 19 හා නොවැම්බර් 25 යන දිනයන්හි සාන්ත කුම්බස් වතුයාය වීක්ෂණය කළ අතර ඩබ්ලිව්. ජේ. ක්‍රෙග් මහතා මාර්තු 26, ජුලි 2 හා දෙසැම්බර් 29 වෙනිද සාන්ත ජොයකිම් වතුයාය වීක්ෂණය කළේ ය.

## මුදල්

අවුරුද්ද තුළ ආදයම රුපි: 5,484,660/- ක් විය. මෙය පසුගිය වසරේ ආදයම රුපි: 589,800/- කින් ඉක්ම විය. සෙස් බද්දෙහි පසුගිය වසරේ රුපි:20,615/- ක අඩුවීමක් හා සසඳන විට මෙම වසරේ දී රුපි: 362,363/- ක වැඩි වීමක් විය. සාන්ත කුම්බස් වතුයායේ ලාභය රුපි: 287,862/-ක් විය. මෙය පසු ගිය වසරේ, රුපි: 252,074/- ක් විය. සාන්ත ජොයකිම් වතුයායේ ලාභය රුපි: 77,381/- ක් විය. පසු ගිය වසරේ රුපි: 47,955/- ක පාඩුවක් ඇති විය. අනෙක් මාර්ගවලින් ලද ආදයම රුපි: 200,809/- කි. 1964 දී මෙය රුපි: 134,497/- ක් විය. මෙය සැදුනේ මෙසේ ය. පොළිය රුපි: 56,301/- කඩ කුලිය රුපි: 2,670/- අමු තේ කොළ විකිණීමෙන් රුපි: 5,072/- කොලෝන කැබෙලි විකිණීමෙන් රුපි: 10,970/- විවිධ අය කිරීම රුපි: 125,796/-.

අයභාර වැය (ක්ෂය ප්‍රමාණය හා ආයෝජනයන්ගේ ක්ෂය හැර) රුපි: 3,783,177/- දක්වා වැඩි විය. මෙය පසු ගිය වසරේ දී රුපි: 3,178,668/- ක් විය.

**වැය වැඩිවීම විශේෂ කොට පහත සඳහන් විෂයන් හී වාර්තා විය:**

| | | |
|---|---|---|
| දෙවු නිලධාරි වේතන ... ... ... | රුපි: | 87,551.00 |
| අන්තර්මධ්‍ය නිලධාරි වේතන ... ... | ,, | 73,519.00 |
| කණිටු ශ්‍රෙණි නිලධාරි වේතන ... ... | ,, | 137,253.00 |
| සුළු සේවක නිලධාරි වේතන ... ... | ,, | 39,375.00 |
| දවස් පඩි කම්කරුවෝ ... ... ... | ,, | 29,096.00 |
| විද්‍යා, කාර්මික ගබඩා හා පොදු කාරක වියදම් ... | ,, | 3,257.00 |
| ගොඩනැගිලි නඩත්තු කිරීම ... ... | ,, | 16,421.00 |
| පොදු ඒකාබද්ධ සේවාවන් ... ... | ,, | 22,168.00 |
| නිලධාරීන්ගේ ගමන් වියදම් ... ... | ,, | 44,419.00 |
| පහතරට ස්ථානය රත්නපුර ... ... | ,, | 71,116.00 |
| විවිධ වේතන ... ... ... | ,, | 559.00 |
| අතිරේක ... ... ... ... | ,, | 90,281.00 |

**පහත සඳහන් විෂයන්හි වැය අඩු විය**

| | | |
|---|---|---|
| පුස්තකාලය හා ප්‍රකාශන ... ... ... | රුපි: | 14,023.00 |
| පරිපාලනය ... ... ... ... | ,, | 7,367.00 |

මූල ධන වියදම රුපි: 1,587/- ක් විය. පසු ගිය වසරේ මේ වියදම රුපි: 3,755,408/- ක් විය. වියදම්වල ප්‍රධාන ශීර්ෂ මෙසේ ය.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි ... ... ... | රුපි: | 829,552.00 |
| ඉඩම් හා සංවර්ධනය ... ... ... | ,, | 45,820.00 |
| ගෘහ භාණ්ඩ හා උපකරණ ... ... | ,, | 52,484.00 |
| විද්‍යාගාර උපකරණ ... ... ... | ,, | 276,693.00 |
| යන්ත්‍රෝපකරණ ... ... ... | ,, | 367,060.00 |

ගොඩනැගිලි සඳහා වියදම් කළ රුපි: 829,552/- ට රත්නපුර පහත රට ස්ථානයේ සාන්ත ජොයකිම් වතුයාය සඳහා වියදම් කළ රුපි: 592,536/- ද ඇතුළත් විය. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට සමුච්චිත ක්ෂය රුපි: 4,600,277/- කි.

ආයතනය සතු ඇවර වත්කම් රුපි: 3,653,720/- කි. රුපි: 1,833,333/- ක් වූ රජයේ ණය ශේෂයත් ඇතුලුව බැරකම් ප්‍රමාණය රුපි: 2,433,545/-.

## ස්තුතිය

ආයතනයේ හා ලංකාවේ තේ කර්මාන්තයට අදාල කටයුතු සම්බන්ධයෙන් දෙන ලද සහයෝගයට හා ආධාරයනට ලන්ඩනයේ ලංකා සංගමයට, ලංකා වැවිලිකරු සංගමයට, ඒජන්සි අංශයට, ලංකා පහත රට නිෂ්පාදන සංගමයට හා අනෙක් ආයතනවලටත් පුද්ගලයනටත් ආයතනයේ ස්තුතිය මණ්ඩලය විසින් වාර්තා කෙරේ.

## ගණන් පරීක්ෂකවරු

ආයතනයේ ගණන් පරීක්ෂකයන් හැටියට පෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම තව දුරටත් ක්‍රියා කළා ය. 1965 දෙසැම්බර් 31 වෙනිදයින් අවසන් වන වර්ෂය සඳහා වූ පරීක්ෂිත ගිණුම් ප්‍රකාශය හා ශේෂ පත්‍රය මේ වාර්තාවට යා කොට ඇත.

ඒ. සී. පෙරේරා,

ලේකම්

## 1965 පස්වෙනි දින පෙරවරු 9.30 ට තලවාකැලේ පැවැති තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි

---

### පැමිණි අය

එෆ්. අමරසූරිය (සභාපති)., ජේ. එල්. කැපර්, සී. පී. චන්මුගම්, ඩබ්ලිව්. ජේ. විල්ඩර්ස්ටන්, ඩී. ටී. හෙට්ටිආරච්චි, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩල්ටන්, ඩී. ඒ. නීල්, ජේ. එල්. ඩී. පීරිස්, එම්. රාජේන්ද්‍රන්, එස්. පී. වෛතිලිංගම්, එම්. ඒ. විටෝල්, ඩබ්ලිව්. ටී. විලියම්ස්, ආචාර්ය ඊ. ඇම්. වෙනරි, (අධ්‍යක්ෂක තේ: පර්: ආ:), ජී. එම්. ස්පාර්ක්ස් (ලේකම්) යන මහත්වරු. ඒ. සී. පෙරේරා (අධ්‍යක්ෂකගේ සේවා සහායක) පී. පත්මනාදන් (සහකාර පරිපාලක නිලධාරි) යන මහත්වරු ද සිටියහ.

පී. ජේ. සී. ඩරන්ට්, පී. නඩේසන් සහ එස්. පත්මනාදන් යන මහත්වරු නොපැමිණිය හැකි බැව් දන්වූහ. ඒ. ටී. ඇම්. සිල්වා මහතාට පැමිණිය නොහැකි විය.

### 1 දෙසැම්බර් 17 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීම් වාර්තා

වාර්තාව අනුමත විය.

### 2 වාර්තාවෙන් උද්ගත වන කරුණු

#### එරාවිළක පිළිබඳ තත්වය

අධ්‍යක්ෂකවරයා විසින් විමසීම සඳහාත් එහි ඉගෙනීම ලබන පශ්චාත්-උපාධි සිසුන් ගේ සහය සඳහාත් මෙම කමිටුව එංගලන්තයේ තිබීම ආයතනයට ඉතා වටිනා අංගයක් බව අධ්‍යක්ෂකවරයා පැවසී ය. මෙම ශිෂ්‍යයන්ට ආචාර්ය ටබ්ස්ගේ උපදෙස් හා සහයෝගය උවමනා විටෙක ලැබේ. නිපුණ විද්‍යාඥයන් ගෙන් සැදුණ මෙම කමිටුව තව දුරටත් පවත්වා ගෙන යන ලෙස ඔහු නිර්දේශ කළේ ය. සාකච්ඡාවෙන් පසුව මෙම කමිටුව ඉදිරියටත් පවත්වා ගෙන යැමට ඒකමතිකව තීරණය කළ අතර මෙහි සේවාවන් ලැබුණු විට ඒ බව මණ්ඩලයට දන්වීමට ද තීරණය විය.

### 3 මණ්ඩලයේ හා කමිටුවල සාමාජිකත්වය

#### මණ්ඩලය

තවත් අවුරුදු තුනක කාල සීමාවක් සඳහා 1965 පෙබරවාරි මස 14 හා 18 වෙනි දින සිට ලංකා වැවිලිකරු සංගමය ඩබ්ලිව්. ටී. විලියම්ස් හා එස්. පී. වෛතිලිංගම් යන මහත්වරු තම නියෝජිතයන් හැටියට පත් කළ බව වාර්තා කරන ලදි. සභාපතිවරයා මේ සාමාජිකයන් දෙදෙනාට සුබ පැතී ය.

### 4 පෙබරවාරි 12 හා මාර්තු 4 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා

### (අ) 12.2.65 දින රැස්වීම

#### සේවක අර්ථසාධක අරමුදල

අර්ථසාධක අරමුදල් නීතිවලට සංශෝධනයක් අගෝස්තු මස පරිපාලන කමිටුව මගින් කම්කරු කොමසාරිස්වරයාගේ හා නීතිඥයන්ගේ අනුමැතිය ලැබේ නම් අනුමත කළ බව සහකාර පරිපාලක නිලධාරි පැවසී ය. මෙම සංශෝධනයනට නීතිඥයන් එකඟ වී නැත. මෙය ප්‍රතිපත්තිමය කරුණක් පමණි. මෙයින් අදහස් කළේ ලාභය එනම් ආයෝජනයන්ගෙන් එන පොළිය සාමාජිකයන්ගේ ගණනට දෙසැම්බර් මස 31 වෙනි දින ඇති මුදල් ප්‍රමාණයන් අනුව ප්‍රමාණාත්මකව බෙදිය යුතු බවයි. මේ මුදල් ප්‍රමාණයන්ට පොළිය දීමත් මෙයින් අදහස් නොකෙරිණි.

14(2) නීතියෙහි, නීතිඥයන් විසින් එකතු කොට ඇති "ප්‍රිසිඩිං" යන වචනය ඉවත් කිරීමට මණ්ඩලය එකඟ විය.

**ඉංජිනේරු අංශයට අතිකාල දීමනා**

ඉංජිනේරු අංශයේ නිලධාරීන්ට මුළු වැටුප උඩ අතිකාල දීමනා ගෙවීමට වූ කමිටුවේ නිර්දේශය ඒකමතිකව අනුමත විය.

**කණිටු හා සුළු සේවක නිලධාරීන්ගේ වැටුප් සංශෝධනය**

යෝජිත සංශෝධනයන්ට යටත් ව කලින් දින පැවැති විශේෂ පරිපාලන රැස්වීම් සහා වාර්තා ඉදිරිපත් කරන ලදී. තීරණයක් ගැනීමට කලින් තම ඇමතිවරුන් විමසන්නට ෂන්මුගම් මහතාටත් තමාටත් අවස්ථාවක් දෙන ලෙස ලෝස් මහතා ඉල්ලී ය. මස අවසානයට පෙර ඔවුන්ගේ අදහස් දැන්වීමට පොරොන්දු විය. වාර්තා සම්මත විය.

යෝජිත සංශෝධනයන්ට යටත්ව පරිපාලන කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

## 5 1965 පෙබරවාරි 19 වෙනි දින පැවැති විද්‍යා කමිටු රැස්වීම් වාර්තා

**(අ) වික්ෂණ නියෝජිතයනට හා ජ්‍යෙෂ්ඨ අධිකාරීන්ට සම්මන්ත්‍රණය**

**යෝජනයට එකඟ විය.**

**(ආ) පර්යේෂණ පිළිබඳ ප්‍රතිපත්ති**

අක්කරයකට යොදන සල්පේට් ඔෆ් ආමෝනියා ප්‍රමාණය පිළිබඳවත් එම ප්‍රමාණයන් ඉන්දියාවේ යොදන ප්‍රමාණයන් හා කෙසේ සැසඳේ දැ යි සී. චන්මුගම් මහතා විමසී ය.

විෂකර මැන්ගනීස් ඇතිවීමත් පසෙහි අම්ල ගතිය අධිකවන නිසාත් දැඩි වශයෙන් ඇමෝනියම් සල්පේට් යෙදීම එතරම් හිතකර නොවේ. අක්කරයකට රාත්තල් 1000 ක් පමණ යෙදීම ලංකාවේ සාමාන්‍ය ය. ඌරියා සම්බන්ධයෙන් නම් නැගෙනහිර අප්‍රිකාවේ එකකට එකක් පටහැනි ප්‍රතිඵල ලැබිණ. තෙත් කාලගුණය ඇති ප්‍රදේශවල මෙය යෙදීමේ එක් ඌණතාවක් නම් ඉතා ඉක්මණින් අතුරු පසට සේදී යෑමය. කෘෂිකර්ම රසායනඥ තැනගේ නිර්දේශයන් ඔහු කියවූ අතර මෙය ප්‍රයෝජන වේ යැයි ඔහු නො සිතයි. ඌරියාවල විශේෂ වාසියක් නම් එය සෑදීම පහසුවීමත් එය පහසුවෙන් ප්‍රවාහනය කිරීමත් ය. එසේ වුවද එය අභාවිතයට යන බව පෙනේ. ඉන්දියාවේ නම් ඌරියා තේවලට නොයොදන බවත් එය සල්පේට් ඔෆ් ඇමෝනියාවලට වඩා සියයට 20 කින් බලපෑම අතින් අඩු බව කැපර් මහතා පැවසී ය. ඌරියා කොළවලට ඉසීමක් වශයෙන් නම් ප්‍රයෝජනවත් බවත් මේ සම්බන්ධයෙන් තමා කරුණු විමසන බවත් වෛතිලිංගම් මහතාගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂවරයා පැවසී ය.

මැග්නීසියම් සල්පේට් හා කෙසරයිට් ආනයනය අධිකව ඉහළ ගොස් ඇත්තේ මන්දැයි අනතුරුව චන්මුගම් මහතා විමසී ය. මේවා තේ කර්මාන්තය සඳහා යොද ගන්න බව හඟන හෙයින් අවශ්‍ය ප්‍රමාණය පිළිබඳව දැනගැනීම අවශ්‍ය ය. ඩොලමයිට් ලංකාවේ ලබා ගත හැකි හෙයින් මෙම පොහොර ආනයනය කිරීම අවශ්‍ය නොවේ යැයි අධ්‍යක්ෂවරයා පැවසී ය. කෙසරයිට් රබර් කර්මාන්තයටත් ඩොලමයිට් තේ කර්මාන්තයටත් යන බව කැපර් මහතා පැවසී ය. මෙම පොහොර සම්බන්ධයෙන් කෘෂිකර්ම රසායනඥ තැන අත්හද බැලීම් කර ගෙන යනු ඇත.

සංශෝධනයන්ට යටත්ව විද්‍යා කමිටු රැස්වීම් වාර්තා ඒකමතිකව අනුමත කරන ලදී.

## 6. 1964 දෙසැම්බර් 11 හා 1965 ජනවාරි 22 දින පැවැති ගොඩනැඟිලි කමිටු වාර්තා

### (අ) 64.12.11 රැස්වීම

**ගරාජය සඳහා නව ස්ථානය**

මේ ප්‍රතිපත්තිය මණ්ඩලය අනුමත කළ අතර අවසාන ඇස්තමේන්තු ගොඩනැඟිලි කමිටුවට ඉදිරිපත් කරන ලෙස නියම කෙරිණ.

**දෙවු ශ්‍රේණි නිවාස අංක 12 එකතු කිරීම**

රුපි: 250 ක ඇස්තමේන්තු මණ්ඩලය අනුමත කළා ය.

**ක්ෂුද්‍ර කම්හල පිළිබඳ සැලැස්ම**

ආචාර්ය කීර්තිසිංහ අසාමි යනවාට වඩා නැගෙනහිර අප්‍රිකාවට යැම ප්‍රයෝජන වේ යැයි අධ්‍යක්ෂවරයා කල්පනා කරයි. ආචාර්ය කීර්තිසිංහ සමඟ කථා කිරීමෙන් පසු අවසාන නිගමනයකට බසිනු ඇත. මණ්ඩලය එකඟ විය.

**පස්සර ප්‍රාදේශීය උපදෙස් නිලධාරි බංගලාව වැඩි දියුණු කිරීම**

ඇස්තමේන්තු මණ්ඩලය අනුමත කළා ය.

**සුළු සේවක නිවාස ආරක්ෂක තාප්පය**

රුපි: 908.30 ක ඇස්තමේන්තු මණ්ඩලය අනුමත කළා ය.

## (ආ) 65.1.22 දින රැස්වීම

**ආචාර්ය වෙනරිගේ බංගලාව—දෙවු ශ්‍රේණිය නිවාස අංක 6**

ඊළඟ රැස්වීම තෙක් මෙය පමා කරන ලදි.

**දෙවු ශ්‍රේණි නිවාස 1-6 යෙන් දිවෙන කාණුව**

රුපි: 3,858.75 ක ඇස්තමේන්තුව අනුමත විය.

**දෙවු ශ්‍රේණි නිවාස අංක 13 හා 14—කෑම කන කාමරවල ජනේලයන් වෙනස් කිරීම**

රුපි: 1000 ක ඇස්තමේන්තු අනුමත විය.

**කනිටු ශ්‍රේණි නිවාස, කඩේ හා කාර්මික අංශයේ ගබඩාව සඳහා ටෙන්ඩර**

එම්. වයි. හේමචන්ද්‍ර සමාගමේ ටෙන්ඩරය මණ්ඩලය අනුමත කළා ය.

ජල සැපයීම සඳහා ටියුබ් ලිං පිළිබඳව ඒඩ්රියන් රයිට් මහතා විමසන ලෙස කැපර් මහතා අදහස් කළේ ය.

ගොඩනැගිලි කමිටු රැස්වීම් වාර්තා ඒකමතිකව අනුමත විය.

පස්වරු 12.10 ට විටෝල් මහතා පිට විය.

## 7. 1965 පෙබරවාරි 13 වෙනි දින පැවැති පහතරට ස්ථාන කමිටු රැස්වීම් වාර්තා

**අත්කර ගැනීම**

යෝජනා කර ඇති රුපි: 50,000 ක මිළට මණ්ඩලය එකඟ විය.

**කර්මාන්ත ශාලාව**

කර්මාන්ත ශාලා ඇස්තමේන්තුවේ පහත සඳහන් වැඩි කිරීම්වලට මණ්ඩලය එකඟ විය.

(1) තට්ටු (දැල්) රුපි. 2,880.00
(2) තෙල් ටැන්කිය රුපි. 1,500.00
(3) බී. අයි. විමිනිය රුපි. 4,800.00
(4) ලෝහ තිරය රුපි. 980.00
(5) රෝලර් රුපි. 900.00
(6) ස්ප්‍රින්ක්ලර්ස් රුපි. 3,000.00
(7) අත්හද බැලීම් අංශයේ ගෘහ භාණ්ඩ රුපි. 8,000.00
(8) කානු රුපි. 3,580.00
(9) නාම පුවරු රුපි. 850.00
(10) අඟල් 15 මේ රොටොවේනය රුපි. 36,000.00

පාම්ගාඩන් හි සවි කොට ඇති දෝණිකා සඳහා රුපි. 53,000.00 ය භාර ගැනීමට මණ්ඩලය එකඟ විය.

**කම්කරු නිවාස**

මේ පිළිබඳව තවමත් සාකච්ඡා වෙන අතර ලඟදී ම වාර්තා කෙරෙනු ඇත.

**ජල සැපයුම**

රුපි. 5,000 ක ඇස්තමේන්තු සම්මත විය.

**කර්මාන්ත ශාලාව**

ඇස්තමේන්තු අනුමත විය.

**තේ පර්යේෂණායතන ගොඩනැගිලි**

අමතර වියදම් එකතුව මෙවන විට ඇස්තමේන්තු කොට ඇති ප්‍රමාණයයන් නොපිට පනින තාක් මණ්ඩලයේ අනුමතිය ලැබිණ. අවසාන ගණන යථා කාලයේ දී ඉදිරිපත් කළ යුතු වේ. පසුගිය වසරේ ගොඩනැගිලි සඳහා වියදම් කළ ප්‍රමාණය ද එම වසරේ සම්මත වැය ප්‍රමාණය ද පෙන්නුම් කළ යුතු වේ.

**කේබල්**

වියදමෙහි වැඩිවීම මණ්ඩලය අනුමත කළා ය.

පහත රට ස්ථාන කමිටු රැස්වීම් වාර්තා සංශෝධනයන්ට යටත්ව සම්මත විය.

## 8. 1965 මාර්තු 4 වෙනි දින පැවැති පත්වීම් කමිටු රැස්වීම් වාර්තා

කලින් දින පැවැති පත්වීම් කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කරන ලදි.

**(අ) සාන්ත කුම්බස් වතුයාය අධිකාරි**

සාකච්ඡාවෙන් පසු කමිටුයේ නිර්දේශ පිළිගන්නා ලදි. තනතුරු නාමය පිළිබඳව අධ්‍යක්ෂවරයා තීරණයක් ගනු ඇත. කම්කරු කටයුතු බලා ගන්නා අධිකාරිට ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් පරිපාලක කමිටුව තීරණය කරනු ඇත.

යෝජිත සංශෝධනයන්ට යටත්ව වාර්තා ඒකමතිකව අනුමත විය.

## 9. 1965 පෙබරවාරි 20 වෙනි දින පැවැති අත්හද බැලීම හා වතුයා කමිටු රැස්වීම් වාර්තා

වාර්තා ඒකමතිකව අනුමත විය.

## 10. මුදල්මය කරුණු

**ප්‍රතිසම්මත වැය**

මණ්ඩලය ප්‍රති සම්මත වැය අනුමත කළා ය.

**පරිපූර්ණ වැය**

පහත දැක්වෙන පරිපූර්ණ වැය අනුමත විය.

(අ) තේ. පර්. ආ. සම්මන්ත්‍රණ සඳහා දිවා භෝජන රුපි. 6000/-
(ආ) සාන්ත කුම්බස් වතුයාය සඳහා ගේට්ටු 3 යි රුපි. 663.75
(ඇ) ගිණුම් අංශයට අතිරේක කාර්යාල කාර්ය සහයක රුපි. 2000/-
(ඇ) අලුත් විද්‍යාගාරය සඳහා ජීව රසායන විද්‍යා උපකරණ රුපි. 5000/

## 11. නිලධාරි කටයුතු

### (1) අධ්‍යක්ෂක තනතුර

ආචාර්ය වෙනරි 31.12.64 වන දින ලංකාවට පැමිණි බවත් එදින සිට රාජකාරි බාර ගත් බවත් මණ්ඩලය සටහන් කර ගන්නා ලදි.

### (2) පත්වීම් හා ඉල්ලා අස්වීම්

පහත සඳහන් පත්වීම් හා ඉල්ලා අස්වීම් සඳහන් කර ගන්නා ලදි.

**පත්වීම්**

ජී. එස්. මුත්තෙටුවගම මයා, අධිකාරි, සාන්ත ජොයකිම්, 64.12.21 සිට.
ඩබ්ලිව්. ජෝසප් මයා, පර්යේෂණ සහායක, කර්මාන්ත ශිල්ප අංශය, 65.1.1. සිට.
වී. අලවත්තේගම, විද්‍යාගාර සහායක, කර්මාන්ත ශිල්ප අංශය, 65.1.4. සිට.
ඩබ්ලිව්.ඩබ්ලිව්.විජේදස, විද්‍යාගාර සහායක, කෘෂිකර්ම රසායන අංශය, 65.1.15. සිට.
බී. වී. රණසිංහ මයා, විදුලි වැඩකරු, සාන්ත ජොයකිම්, 65.2.1. සිට.
ඩබ්ලිව්. ඒ. සී. ද සිල්වා මයා, විදුලි වැඩකරු, සාන්ත කුම්බස්, 65.2.1. සිට.
එන්. එම්. ජයතිලක මයා, ගණක ලිපිකරු, 65.2.1. සිට.
පී. දෙන් ගුණසේන මයා, රියැදුරු, 65.2.22. සිට.
ටී. එෆ්. සල්දින් මයා, කණිටු කර්මාන්තඥ සහායක, කර්මාන්ත ශිල්ප අංශය, 65.3.15 සිට.
කේ.සිවලිංගම් මයා, කණිටු කර්මාන්තඥ සහායක, කෘෂිකර්ම රසායන විද්‍යා අංශය, 65.3.8. සිට.
ඒ. සෝමරත්න මයා, කණිටු කර්මාන්තඥ සහායක, කෘෂිකර්ම රසායන විද්‍යා අංශය, 65.4.1. සිට.
වී. එච්. පෙරේරා මයා, කණිටු කර්මාන්තඥ සහායක, ජීව රසායන විද්‍යා අංශය, 65.4.1. සිට.
ඩී. ජානකිරාම් මයා, කණිටු කර්මාන්තඥ සහායක, පැලෑටි ප්‍රජනනය, 65.4.1. සිට.

**අස්වීම්**

ටී. ඒ. ඊ. සිරිවර්ධන මයා, රියැදුරු, 64.10.29. සිට.

සී. ඇන්ඩෘස් මයා, අධිකාරි, සාන්ත ජොයකිම්, 64.12.23. සිට.

ඒ. ඒල්. ජේ. ද කෲස් මයා, කර්මාන්තඥ සහායක, 65.1.19. සිට.

ඩබ්ලිව්. එම්. බණ්ඩාරනායක මයා, පර්යේෂණ සහායක, 65.1.20. සිට.

කේ. ගෝවින්දසාමි මයා, කර්මාන්තඥ සහායක, 65.1.25. සිට.

ඊ. ඕ. ස්ටුවර්ට් මයා, කර්මාන්තඥ සහායක, 65.2.28. සිට.

ඇස්. ඇම්. කන්දසාමි මයා, කර්මාන්තඥ සහායක, 65.3.31. සිට.

ජේ. ජී. ජී. තෙන්නකෝන් මයා, අධිකාරි, සාන්ත කුම්බස්, 65.4.30. සිට.

### (3) චෙක් පත් අත්සන් කිරීමට බලය

1965.3.5. සිට ආචාර්ය ඒ. ඩබ්ලිව්. ආර්. ජොයකිම් වෙනුවට ලංකා තේ පර්යේෂණායතන අධ්‍යක්ෂක ආචාර්ය ඊ. එම්. වෙනරිට පහත සඳහන් ජංගම ගිණුම් සඳහා චෙක් පත් අත්සන් කිරීමට බලය ලැබේ'' යන යෝජනය එස්. පී. වෛතිලිංගම් මහතාගේ යෝජකත්වයෙන් ද ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතාගේ ස්ථිරත්වයෙන් ද සම්මත විය.

(1) ලංකා තේ පර්යේෂණායතනය
(2) ලංකා තේ පර්යේෂණායතන නිලධාරි අර්ථ සාධක අරමුදල
(3) තේ පර්යේෂණායතන කනිටු නිලධාරි වෛද්‍ය අරමුදල

### (4) මණ්ඩලයේ මුද්‍රාව

සභාපතිවරයා ඉදිරිපිට දී 12.2.65 වන දින ආචාර්ය වෙනරිගේ ගිවිසුමට මණ්ඩලයේ මුද්‍රාව තැබූ බව වාර්තා කරන ලදි. ආවරණ අනුමතිය ලැබිණ.

**(5) කොළඹ ක්‍රම ශිෂ්‍යත්ව**

මේ වසර සඳහා අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කරන ලද පහත සඳහන් ශිෂ්‍යත්ව මණ්ඩලය අනුමත කළා ය.

1. ඒ. ආර්. සෙබස්තියන්පිල්ලේ, පර්යේෂණ සහායක, පැලෑටි බෝකිරීම.
2. ජී. ආර්. රොබර්ට්ස්, පර්යේෂණ සහායක, ජීව රසායන අංශය.
3. එස්. සිවසුබ්‍රමානියම්, පර්යේෂණ සහායක, කෘෂිකර්ම රසායන අංශය.
4. ටී. සී. ඉසෙඩ්. ජේමන්, කර්මාන්තඥ සහායක. කෘෂිකර්ම රසායන අංශය.
5. ඩබ්ලිව්. ඩබ්ලිව්. රෙඩ්ලික්, කර්මාන්තඥ සහායක,පැලෑටි ව්‍යාධි විද්‍යා අංශය.

## 12. වෙනත් කරුණු

**(1) කර්මාන්ත ශිල්පාංශයේ නිලධාරීන්ට විපඨ දීමනා**

පරිපාලන කමිටුව මගින් සලකා බැලීම සඳහා මෙය පමා කරන ලදී.

**(2) වෘත්තිය සංගම් නියෝජනය**

කණිටු හා සුළු සේවක නිලධාරි වෘත්තිය සංගම්වල සභාපති හා ලේකම් වරුන්ට පස්වරු 1.05 ට මණ්ඩල රැස්වීමට ආරාධනය කළා ය.

කණිටු නිලධාරි වෘත්තිය සංගමයේ සභාපති මහතා මණ්ඩලය අමතමින් පසුගිය අවුරුදු 14 ඇතුළත කණිටු නිලධාරීන් අධ්‍යක්ෂවරයාටත්, මණ්ඩලයටත් සම්පූර්ණ සහයෝගය දුන් බවත් ඉතා සාමකාමීව සිටි බවත් පැවසී ය. වැටුප් වැඩි කිරීමට කිසි විටෙක ඉල්ලීමක් වූ විට මණ්ඩලය වැටුප් හා සේවා පහසු කම් අඩු කොට ඇත. එහෙත් ජීවන තත්වය ඉහළ ගොස් ඇත. අනෙක් තැන්වල නම් වැඩ වර්ජන මාර්ගයෙන් ඉල්ලුම් ඉටු කර ගන්නා තත්වයක් උද්ගතව ඇත. සාන්ත කුම්බස් හි ඇති දුෂ්කරතාවයන් ගැන නොයෙක් විට පැමිණිලි කොට ඇත. නිලධාරීන්ට ගෙවන වැටුප් ඉතා ඉහළ යැ යි සමහර මණ්ඩල සාමාජිකයන් හිතනු ඇත. එහෙත් වියදම් ගැන කල්පනා කර බලන කළ එය එසේ නොවේ. වියදම පියවීම ඉතා අමාරු ය. සංගමය මගින් ඉදිරිපත් කොට ඇති සාධාරන ඉල්ලීම්වලට ඉඩ දෙන ලෙස ඔහු ඉල්ලා සිටියේ ය.

නිලධාරීන්ගේ ඉතා විශිෂ්ය හැසිරීම පිළිබඳවත් අධ්‍යක්ෂක හා මණ්ඩලයට දෙන ලද සහයෝගයටත් සභාපතිවරයා නියෝජිත පිරිසට ස්තුති කළේ ය. පසුගිය අවුරුදු දහය තුළ තමා මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළ බවත් නිලධාරීන් ආයතනයට සේවය කළ අන්දම තමාගේ සිතෙහි පවතින බවත් සභාපතිවරයා පැවසී ය. වැටුප් හා සේවා තත්වයන් පහත් කිරීමක් ඇති නොවන බවත් මාසය අවසාන වන විට ඔවුන්ගේ ඉල්ලීම් ඉටු කරන බවටත් ඔහු ප්‍රතිඥා දුන්නේ ය. එවිට සියලු දෙනාම සෑහීමට පත් වනු ඇත.

ජී. ඇම්. ස්පාර්ක්ස්,
ලේකම්

## 1965 ජුනි 21 වෙනි දින පෙරවරු 9 ට කොළඹ පැවැති තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි

### පැමිණි අය

එෆ්. අමරසූරිය (සභාපති)., ජේ. එල්. කැපර්, සී. පී. වන්මුගම්, ඩබ්ලිව්. ජේ. විල්ඩර්සන්, පී. ජේ. සී. ඩරන්ට්, ඩී. බී. එල්ලපොල, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩ්ල්ටන්, ඩී. ඒ. නීල්, එස්. පත්මනාදන්, ජේ. එල්. ඩී. පීරිස්, එම්. රාජේන්ද්‍රම්, එස්. පී. වෛතිලිංගම්, එච්. ඒ. විටෝල්, ඩබ්ලිව්. ටී. විලියම්ස්, ආචාර්ය ඊ. එම්. චෙනරි (අධ්‍යක්ෂක තේ පර්යේෂණායතනය) සහ ජී. එම්. ස්පාර්ක්ස් (ලේකම්) යන මහත්වරු. අධ්‍යක්ෂකගේ සේවා සහයක ඒ. සී. පෙරේරා මහතා ද පැමිණ සිටියේ ය.

ඩී. සී. එල්. අමරසිංහ හා මහජන මන්ත්‍රී ඩී. ජේ. රණවීර යන මහත්වරු තමන්ට පැමිණිය නොහැකි බැව් දැන්වූහ.

### 1. 1965 මාර්තු පස් වෙනි දින පැවති මණ්ඩල රැස්වීම් වාර්තා

වාර්තා සම්මත විය.

### 2. වාර්තාවෙන් උද්ගත වන කරුණු

**පෙම්බ්‍රෝක් බංගලාව**

බංගලාවට යෑමට පාරක් දීමටත් ජලය සැපයීමට ඉඩ දීමටත් සමාගම දැන් එකඟ වී ඇති බව ප්‍රධාන පරිපාලක නිලධාරි පැවසී ය. නීතිඥයෝ මේ කරුණ පිළිබඳ කටයුතු කර ගෙන යති.

**අර්ථ සාධක අරමුදල වෑඩි කිරීම**

වෛතිලිංගම් මහතා නැගූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් සංඛ්‍යා සාද අවසාන බවත් ඊ ලඟ පියවර මේ ගණන් පරීක්ෂණය කිරීම බවත් ප්‍රධාන පරිපාලක නිලධාරි පැවසී ය.

**සාන්ත කූම්බ්ස් වතුයාය—අධිකාරි තනතුර**

එල්. ඒ. සිවරත්නම් මහතා කෘෂිකර්මාන්තඥ වශයෙන් පත් කිරීම මණ්ඩලය අනුමත කළා ය.

**තේ රසාඥ තනතුර**

තේ රාසාඥ වශයෙන් සී.එච්.වික්‍රමසිංහ මහතා පත් කිරීම මණ්ඩලය අනුමත කළා ය.

### 3. මණ්ඩලයේ හා කමිටුවල සමාජිකත්වය

**මණ්ඩලය**

(1) 65.6.1. දින සිට කෘෂිකර්ම අධ්‍යක්ෂක වශයෙන් ඒ. ටී. එම්. සිල්වා මහතා. වෙනුවට ඩී. සී. එල්. අමරසිංහ මහතා. පත් වූ බව.

(2) 65.3.27 දින සිට පහත රට නිෂ්පාදක සංගමයේ සභාපති හැටියට පී. නඩේසන් මහතා වෙනුවට ඩී. බී. එල්ලපොල මහතා. පත් වූ බව.

(3) 65.6.16. දින සිට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් මහජන මන්ත්‍රී ඩී. ජේ. රණවීර මහතා. පත් වූ බව.

වාර්තා කරන ලදි.

මණ්ඩලයේ සාමාජිකත්වය අත් හැර යෑමේ දී මණ්ඩලයට සුබ පතමින් ඒ. ටී. එම්. සිල්වා මහතා ලිපියක් එවා ඇති බව සභාපතිවරයා දැන්වීය. අස්වන සාමාජිකයන්ට සභාපතිවරයා ස්තූති කළ අතර නව සමාජිකයන් පිළිගත්තේ ය. මණ්ඩලය සතුට පළ කළා ය.

## 4. 1965 මැයි 28 වෙනිද පැවති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා

**(1) විශේෂ වැටුප් වැඩි කිරීම හා උසස් කිරීම**

නිලධාරි මණ්ඩලයට විශේෂ වැටුප් වැඩි කිරීම හා උසස් කිරීම පිළිබඳව වූ අධ්‍යක්ෂකවරයාගේ යෝජනය මණ්ඩලය අනුමත කළා ය. එහෙත් එම අවස්ථා ක්‍රියාත්මක කිරීමට කලින් පරිපාලන කමිටුව මගින් මණ්ඩලයේ අනුමතිය ලබා ගත යුතු වේ.

**(2) පරිපූර්ණ වැය**

පරිපූර්ණ වැය මණ්ඩලය අනුමත කළා ය.

**(3) තුර්කියේ තේ පර්යේෂණායතනයේ සහකාර අධ්‍යක්ෂකගේ ඉල්ලීම**

**කමිටුවේ නිර්දේශ සම්මත විය.**

හෙට්ටිආරච්චි හා වෛතිලිංගම් යන මහතුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පරිපාලන කමිටු වාර්තා සම්මත විය.

## 5. 1965 ජූනි 7 වෙනි දින පැවති ගොඩනැගිලි කමිටු රැස්වීම් වාර්තා

**(1) 1966 සඳහා සැලැස්ම**

මෙම කරුණු ගොඩනැගිලි කමිටුව වෙත ම තැබීමට මණ්ඩලය තීරණය කළා ය.

**(2) වතුයාය ගොඩනැගිලි වැඩ සටහන ආයතන වැඩ සටහන සමග ඒකාබද්ධ කිරීම**

මණ්ඩලය අනුමත කළා ය.

**(3) ව්‍යාප්ති නිලධාරීන්ට නිවාස**

මණ්ඩල අනුමතිය ලැබිණ.

**(4) පහත රට ගොඩනැගිලි**

මණ්ඩල අනුමතිය ලැබිණ.

කැපර් මහතාගේ හා විලියම්ස් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් රැස්වීම් වාර්තා ඒකමතිකව අනුමත විය.

## 6. 1965 මැයි 27 වන දින පැවති පහත රට ස්ථාන කමිටු රැස්වීම් වාර්තා

ජේ. එල්. ඩී. පීරිස් මහතාගේ සහ ජේ. එල්. කැපර් මහතාගේ යෝජනා ස්ථිරත්ව-යෙන් වාර්තා ඒකමතිකව සම්මත විය.

## 7. 1965 මැයි 8 වෙනි දින පැවති අත්හද බැලීම් හා වතුයා කමිටු රැස්වීම් වාර්තා

සාමූහික පර්යේෂණ පිළිබඳ පත්‍රිකාව ඉදිරිපත් කළ අතර එය සටහන් කරගන්නා ලදි.

මෙම වැඩ සටහන ඉතා හොඳින් පිළිගෙන ඇති බව අධ්‍යක්ෂකවරයා පැවසී ය.

මෙම අත්හදබැලීම් සඳහා මූලික වියදම වශයෙන් රුපියල් 55,000 ක් සම්මත විය.

රැස්වීම් වාර්තා ඒකමතිකව අනුමත විය.

## 8. නිලධාරි කටයුතු

**නිවාඩු**

පහත සඳහන් කරුණු සඳහන් විය.

1. ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට් මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂක සහ කෘෂිකර්ම රසායනඥ. 1.6.65 සිට 29.9.65 දක්වා, විදෙස් නිවාඩු පිට.

2. ආචාර්ය ඒ. ක්කර් පැලැට් ව්‍යාධි විද්‍යාව පිළිබඳ උපදේශක. 13.6.65 සිට 12.9.65 දක්වා විදෙස් නිවාඩු පිට.

3. ජේ. ඊ. ක්‍රැනම් මහතා කෘෂි විද්‍යාඥ. 23.6.65 සිට 12.9.65 දක්වා විදෙස් නිවාඩු පිට.

4. සී. බී. පෝස්ටර් බාර්හැම් මහතා ප්‍රධාන උපදෙස් නිලධාරි. 2.7.65 සිට 3.10.65 දක්වා විදෙස් නිවාඩු පිට.

5. ඩබ්ලිව්. ජෝශප් මහතා පර්යේෂණ නිලධාරි, කර්මාන්ත ශිල්පාංශය. එංගලන්තයේ බ්‍රිතාන්‍ය කර්මාන්ත සම්මේලනය මගින් ප්‍රදනය කරන ලද ඉංජිනේරු අංශයේ පුහුණුවක් සඳහා පිටත් විය.

6. ආචාර්ය ජී. ඩබ්ලිව්. සැන්ඩර්සන්, ජීව රසායනඥ. 8.3.65 වෙනි දින විදෙස් නිවාඩුවෙන් පසු ආපසු පැමිණියේ ය.

**2. බැංකු ගිණුමක් ඇරඹීම**

1965/73—බී 17 සහ 1965/87—බී 18 යන පත්‍රිකා මණ්ඩලය අනුමත කළා ය.

## 9. පරිපූර්ණ වැය

| | |
|---|---|
| 5 වන කරුණ ජීව විද්‍යා අංශය—මූලධන භාණ්ඩ ... ... | රු. 2,000.00 |
| පාරිභෝගික භාණ්ඩ (වීදුරු භාණ්ඩ, කාබනික රසායන ද්‍රව්‍ය, අමතර කොටස් ... ... ... ... | රු. 13,000.00 |
| 6 වන කරුණ—නැෂනල් මුදල් මිණුම් යන්ත්‍රය ... ... | රු. 40,000.00 |
| 7 වන කරුණ—විදුලිබල විරහිත වීම සම්බන්ධ යන්ත්‍ර, සාන්ත ජොයකීම් ... ... ... ... ... | රු. 74,000.00 |
| 8 වන කරුණ—ප්‍රජා මණ්ඩල භාණ්ඩ ... ... ... | රු. 2,000.00 |

පරිපූර්ණ වැය සම්මත විය.

## අනෙක් කරුණු:

**1. පත්වීම් හා ඉල්ලා අස්වීම**

**පත්වීම්**

| | |
|---|---|
| එල්. ඒ. සිවරත්නම් මහතා, කෘෂි කර්මාන්තඥ | 5.4.65 |
| සී. එච්. වික්‍රමසිංහ මහතා, තේ රසායනඥ | 1.6.65 |
| කේ. එච්. බී. ඩී. ඩයස් මහතා, මිකැනික් පහතරට, ස්ථානය රත්නපුර | 1.1.65 |

**අස්වීම්**

| | |
|---|---|
| ජේ. ජී. ජී. තෙන්නකෝන් මහතා, අධිකාරි, සාන්ත කූම්බ්ස් වතුයාය | 30.4.65 |
| ආචාර්ය එච්. එන්. හැසලෝ, ප්‍රධාන ශස්‍ය විද්‍යාඥ | 7.7.65 |
| ආචාර්ය එස්. සී. වනිගරත්න, පර්යේෂණ නිලධාරි, ශස්‍ය විද්‍යාව | 1.5.65 |
| එම්. එච්. ආරියරත්න මහතා, ආයතන ලිපිකරු | 15.4.65 |
| ඩී. එස්. ජයසේකර මහතා, පුස්තකාල සහායක | 21.5.65 |
| ටී. එම්. එෆ්. බුරා මහතා, විද්‍යාගාර සහායක රසායන, විද්‍යා අංශය | 1.6.65 |
| පී. පත්මනාදන් මහතා, සහකාර පරිපාලන නිලධාරි | 18.7.65 |

**2. මණ්ඩලයේ මුද්‍රාව**

ආචාර්ය සැන්ඩර්සන් හා ටොල්හර්ස්ට් මහතුන්ගේ ගිවිසුම් සම්බන්ධයෙන් මණ්ඩලයේ මුද්‍රාව 28,5,65 වෙනි දින තබන ලද බව දැනුම් දෙන ලදී.

පස්සර ප්‍රාදේශීය උපදෙස් නිලධාරිට බැංකු ගිණුමක් ගෙන යෑම පිළිබඳ ගිවිසුමට මණ්ඩලයේ මුද්‍රාව තැබීම ද අනුමත විය.

**3. තේ ත්‍රෛ මාසිකය**

විද්‍යාත්මක සඟරාවක් වන තේ ත්‍රෛමාසිකයේ මණ්ඩල රැස්වීම් වාර්තාවල සාරාංශයන් පළ වන බව අධ්‍යක්ෂකවරයා පැවසී ය. අනාගතයේ දී මේ වාර්තා වාර්ෂික වාර්තාවේ පළමු කොටසෙහි පළ කිරීමට ඔහු අදහස් කරයි. මණ්ඩලය එකඟ විය.

රැස්වීම පස්වරු 12.45 අවසාන විය.

ජී. එම්. ස්පාර්ක්ස්,
ලේකම්

## 1965 අගෝස්තු 23 වෙනි දින පෙරවරු 9.00 කොළඹ පැවැත් පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි

**පැමිණි අය:**

එෆ්. අමරසූරිය (සභාපති), ඩී. සී. එල්. අමරසිංහ, ජේ. එල්. කැපර්, සී. පී. චන්මුගම්, පී. ජේ. සී. ධරන්ච්, ඩී. බී. එල්ලපොල, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩ්ල්ටන්, ඩී. ඒ. නීල්, එස්. පත්මනාදන්, එස්. පී. වෛතිලිංගම්, ඩබ්ලිව්. ටී. විලියම්ස් යන මහත්වරු ද, ආචාර්ය ඊ. ඇම්. වෙනරි (අධ්‍යක්ෂක, තේ.ප.ආ.), ජී. එම්. ස්පාර්ක්ස් මහතා (ලේකම්), අධ්‍යක්ෂකගේ සේවා සහායක ඒ. සී. පෙරේරා මහතා ද පැමිණ සිටියේ ය.

ඩබ්ලිව්. ජේ. වීල්ඩසන් හා එච්. ඒ. විටෝල් යන මහත්වරු තමන්ට පැමිණිය නොහැකි බැව් දන්වූහ. ජේ. එල්. ඩී. පීරිස් හා ඩී. ජේ. රණවීර යන මහතුන්ට පැමිණිය නොහැකි විය.

### 1. 1965 ජූනි 21 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීම් වාර්තා

වාර්තා සම්මත විය.

**(1) හන්තාන හා පස්සර අතුරු ස්ථාන සඳහා ක්ෂුද්‍ර කම්හල්**

පුවත්පත් මගින් ටෙන්ඩර කැඳ වූ බවත් පහත දැක්වෙන අයුරින් අඩු ම ටෙන්ඩර කරුවනට මෙම වැඩ පවරන ලද බවත් ලේකම්වරයා පැවසී ය.

මහනුවර, ෂෙල්ටන් සහෝදරයෝ—රු. 19,791.80 (හන්තාන)

දෙබැද්ද, ඩේවිඩ් සිඤ්ඤෝ—රු. 19,656.90 (පස්සර)

මණ්ඩලය අනුමත කළා ය.

**(2) සී. ටී. සී. යන්ත්‍රෝපකරණ**

මෙම යන්ත්‍ර නිෂ්පාදනය කරණ සමාගම් දෙකෙන් මිළ විමසා යවා ඇති බව අධ්‍යක්ෂ-වරයා පැවසී ය. සාත්ත කුම්බස් හා සාන්ත ජොයකිම් හී පර්යේෂණ සඳහා මේ සමාගම් වලින් යන්ත්‍ර දෙක බැගින් මිළ දී ගැනීමට ඔහු අදහස් කරයි. මණ්ඩලය අනුමත කළා ය.

### 2. මණ්ඩලයේ හා කමිටුවල සාමාජිකත්වය

**මණ්ඩලය**

කෘෂිකර්ම අධ්‍යක්ෂක ඩී. සී. එල්. අමරසිංහ මහතා සභාපතිවරයා විසින් පිළිගන්නා ලදි.

**පරිපාලන කමිටුව**

65.8.23 වෙනිද සිට පරිපාලන කමිටුව සඳහා ඩී. බී. එල්ලපොල මහතා පත් කරන ලදි.

**පහත රට ස්ථාන කමිටුව**

පහතරට ස්ථාන කමිටුවට තමාවත් යා කරන ලෙස ඩී. බී. එල්ලපොල මහතා ඉල්ලා සිටියේ ය. මණ්ඩලය එය අනුමත කළාය.

ඔක්තෝබර් මස මුල දී ලංකාවෙන් පිටත්ව යන හෙයින් 65.8.31 වෙනි දින සිට බලපාන හැටියට ඩබ්ලිව්. ටී. විලියම්ස් මහතා මණ්ඩලයෙන් අස් වී ඇති බව සභාපතිවරයා මණ්ඩලයට දැන්විය. වැවිලිකරු සංගමය මගින් පත් කිරීමක් කරන බව ද සඳහන් කර ගන්නා ලදි. පසුගිය අවුරුදු ගණනාවක් තුළ කරන ලද සේවයට සභාපතිවරයා විලියම්ස් මහතාට ස්තුති කළේ ය.

## 3. පරිපූර්ණ ඇස්තමේන්තු

14 වන වැය, 5 වන අතුරු ශීර්ෂය යටතේ රත්නපුර පහතරට ස්ථානය සඳහා අතිකාල දීමනා වශයෙන් රු. 250 ක පරිපූර්ණ ඇස්තමේන්තුවක් අනුමත කළා ය.

## 4. වෙනත් කරුණු

### (1) පත්වීම් හා ඉල්ලා අස්වීම්

#### 1. පත්වීම්

සී. එම්. බවනාතර් මහතා, කාර්යාල කාර්ය සහයක, 65.6.15 සිට.
වී. එන්. බුහාර් මහතා, රියැදුරු/කාර්යාල සහකරු, පස්සර අතුරු ස්ථානය, 65.6.1. සිට.

#### 2. ඉල්ලා අස්වීම්

එල්. එස්. වේරගොඩ මහතා, කර්මාන්තඥ සහයක, 65.1.31. සිට.
එස්. ඒ. පියසේන මහතා, තාවකාලික මුරකරු, 65.4.30 සිට.
එල්. ඒ. ගුණපාල මහතා, මුරකරු, 65.7.1 සිට.
නෙස්ටර් පීරිස් මහතා, ලඝුහන්කරු, 65.7.14 සිට.
ජේ. පී. ජේ. ර්. නවරත්න මහතා, වාර්තා ලිපිකරු, 65.8.23 සිට.

#### 3. ශිෂ්‍යත්ව

ඒ. ආර්. සෙබස්තියම්පිල්ලේ මහතා, පර්යේෂණ නිලධාරි, පැළෑටි ප්‍රජනනය. 65.8.6 එක්සත් රාජධානිය බලා පිටත් විය.
ඩී. ජානකිරාම් මහතා, කර්මාන්තඥ සහායක. පැළෑටි ප්‍රජනන අංශය, 65.7.8 දින ඉන්දියාව බලා පිටත් විය.

### (2) මණ්ඩලයේ මුද්‍රාව

#### 1. පෙම්බ්‍රෝක් බංගලාව

යෝජිත අත්කර ගැනීම් පාලන පනතෙන් උද්ගතවන නීතිමය ප්‍රශ්නයක් නිසා පැවරීමේ ඔප්පු ප්‍රමාද කරන්නට සිදු වූ බව ලේකම්වරයා පැවසී ය. පාර්ලිමේන්තුව විසුරුවා හළ විට මෙම පනත අහෝසි විය. මෙම පනත නැවත ඉදිරිපත් කරන බව නීතිඥයන්ට දන්වා ඇත. කලින් සම්මත වූ යෝජනයේ සඳහන් සාමාජිකයන් දැනට මණ්ඩලයේ නොමැති හෙයින් නව යෝජනාවක් සම්මත කර ගැනීම අවශ්‍ය ය.

ජේ. එල්. කැපර් මහතාගේ යෝජනය සී. පී. වන්මුගම් මහතා ස්ථිර කරනු ලැබ. පහත දැක්වෙන යෝජනය මණ්ඩලය අනුමත කළා ය.

> "කලුතර දිස්ත්‍රික්කයේ නාගොඩ පිහිටි පෙම්බ්‍රෝක් බංගලාව හා ඊට අනුබද්ද අයිතිය රුපියල් 15,000 ක මිළකට විකිණීමට මණ්ඩලය එකඟ විය.
>
> මෙම විකිණීම දැක්වෙන ගිවිසුමට මණ්ඩලයේ මුද්‍රාව සභාපති එෆ්. අමරසූරිය, මණ්ඩලයේ සාමාජිකයන් වන ජේ. එල්. ඩී. පීරිස් හා ආචාර්ය ඊ. එම්. වෙනරි. ඉදිරිපිට දී තැබිය යුතුයැ යි ද අනුමත කළා ය."

මිළ දී ගත් මිල දක්වෙන කුවිත්තාසියට ද මණ්ඩලයේ මුද්‍රාව තැබීම මණ්ඩලය අනුමත කළා ය.

#### 2. හන්තාන හා පස්සර අතුරු ස්ථාන සඳහා ක්ෂුද්‍ර කම්හල්

ජේ. එල්. කැපර් මහතාගේ යෝජනය සී. පී. වන්මුගම් මහතා අනුමත කරනු ලැබ ඉහත සඳහන් කම්හල් ඉදි කිරීම සම්බන්ධ කොන්ත්‍රාත් ලියවිලිවලට මණ්ඩලයේ මුද්‍රාව තැබීමට මණ්ඩල අවසරය ලැබිණ.

**3. පස්සර ප්‍රාදේශීය උපදෙස් නිලධාරි නිවාස විශාල කිරීම**

ජේ. එල්. කැපර් මයාගේ යෝජනය සී. පී. වන්මුගම් මහතා ස්ථිර කරන ලදුව ඉහත සඳහන් ගොඩනැගිල්ල සඳහා වූ කොන්ත්‍රාත්තුවට මණ්ඩලයේ මුද්‍රාව තැබීම අනුමත විය.

**(3) 65.9.6 වන දින පැවැත්වෙන දකුණු ඉන්දියානු එක්සත් වැවිලිකරුවන්ගේ සංගම් සම්මේලනය**

ඉහත සඳහන් සම්මේලනයේ දී, එස්. පී. වෛතිලිංගම් හා ආචාර්ය ආර්. එල්. ද සිල්වා යන මහතුන් මණ්ඩලය හා ආයතනය වෙනුවෙන් පෙනී සිටීම මණ්ඩලය අනුමත කළා ය.

**(4) අධ්‍යක්ෂකවරයාගේ නිවාඩු**

නිවාඩු පිට සිටින විට ලබන වර්ෂයේ දී ඔහු ජපානය හරහා එංගලන්තයට යෑමට බලාපොරොත්තු වන බව අධ්‍යක්ෂකවරයා පැවසී ය. මෙවිට ඔහු තෙලීම් යන්ත්‍ර හා වියලන යන්ත්‍ර පරීක්ෂා කරනු ඇත. මණ්ඩලය අනුමත කළා ය.

පස්වරු 1.10 ට රැස්වීම අවසන් විය.

**ජී. එම්. ස්පාර්ක්ස්,**
ලේකම්

# 1965 දෙසැම්බර් 13 වෙනි දින පෙරවරු 9 යට කොළඹ පැවැති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමෙ සංක්ෂිප්ත වාර්තාව

**පැමිණි අය:**

එෆ්. අමරසූරිය (සභාපති), ජේ. එල්. කැපර්, ඩබලිව්. ජේ. විල්ඩස්ටන්, සී. පී. චන්මුගම්, ඒ. පී. පින්වර්, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩල්ටන්, එස්. පත්මනාදන්, ජේ. එල්. ඩී. පීරිස්, එම්. රාජේන්ද්‍රම්, ඩී. ජේ. රණවීර, මහජන මන්ත්‍රී, ඒ. ජී. සාජ් පොල්, ආචාර්ය ඊ. එම්. චෙනරි (අධ්‍යක්ෂක) හා ඒ. සී. පෙරේරා (ලේකම්) යන මහත්වරු.

ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු (සහකාර අධ්‍යක්ෂක) සහ එස්. තියාගරාජා (සහකාර පරිපාලක නිලධාරි) යන මහත්වරු ද පැමිණ සිටියහ.

ඩී. බී. එල්ලපොල සහ පී. ජේ. සී. ඩරන්ට් යන මහත්වරු තමන්ට පැමිණිය නො හැකි බව දන්වූහ.

## 1. 1965 අගෝස්තු 23 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා

වාර්තාව සම්මත විය.

## 2. වාර්තාවෙන් උද්ගත වන කරුණු

**ක්ෂණික තේ**

සිටී සමාගම ඔවුන්ගේ 65.11.24 දින දරණ ලිපියෙන් මෙහි අයිතිය සීමාසහිත යුනිලීවර්ස් සමාගමට මාරු කිරීම දන්වූ බව වාර්තා කරන ලදි.

## 3. 1965 සැප්තැම්බර් 29 වන දින පැවැති පහත රට ස්ථාන කමිටු රැස්වීම් වාර්තා අත්හද බැලීම් අංශයේ තෙත් ගතිය

අත්හද බැලීම් අංශයේ සිමෙන්තිවල ඇති තෙත් ගතිය ජල පයිප්ප වල සිදුරුවීමක් නිසා ඇතිවන්නක් බව සොයා ගත් බවත් මේ වරද දැන් නැති කොට ඇති බවත් ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු මහතා පැවසී ය.

ජේ. එල්. කැපර් මහතා යෝජනා කරන ලදුව එස්. පී. වෛතිලිංගම් මහතා ස්ථිර කරනු ලැබ යෝජිත සංශෝධනයන්ට යටත්ව රැස්වීම් වාර්තා සම්මත විය.

## 4. 1965 නොවැම්බර් මස 4 වෙනි දින පැවැති ගොඩනැගිලි රැස්වීම් වාර්තා

**(1)** කනිටු නිලධාරී නිවාස

ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් එවන ලද පරිපූර්ණ වැය සම්මත විය.

**(2)** විද්‍යාභාණ්ඩ ගබඩාව

චන්මුගම් මහතාගේ ප්‍රශ්නයට පිළිතුරු දුන් අධ්‍යක්ෂවරයා පොහොර හා භාණ්ඩ තැන්පත් කිරීමට ඉක්මණින් ඉඩ කඩ අවශ්‍ය බව පැවසී ය. මේවා දැනට විද්‍යාගාරයේ පිටුපස රැස් කොට ඇත. කැන් සඳහා තෙත් ගතිය නොමැති ගබඩාවක් අවශ්‍ය ය. මෙවිට කැන්වල මිළ පිළිබඳව ෂන්මුගම් මහතා විමසී ය. මුලින් ටොන් 50 ක් පමණ වූ සුළු ප්‍රමාණයක් ආනයනය කරන ලදි. කැන් හා සල්ෆේට් ඔෆ් අමෝනියා අතර මිළෙහි වෙනස නැව් ගාස්තු නිසා ය. සල්ෆේට් ඔෆ් අමෝනියා ගෙන්වීමේ දී කැන් වලට නොලැබෙන විශේෂ වරප්‍රසාද ලැබේ. කැන් ද විශාල ප්‍රමාණයෙන් ගෙන්වන විට මෙය ලබා ගත හැකි වේ. ඉන්දියාවේ හා ලංකාවේ මිළ අතර වෙනස පොහොර ගෙන්වීමේදී ලංකාව සියයට 12 ක බද්දක් අය කරන අතර ඉන්දියාව එරටට ගෙන්වන පොහොර සඳහා බදු අය කරන්නේ නැතැයි ද කැපර් මහතා පිළිතුරු දුනි.

(3) ගොඩනැගිලි නඩත්තු වැඩ

1966 ජනවාරි 1 වෙනි ද සිට නඩත්තු කිරීම් වෙළෙඳ කළමනාකරු හා වැඩ ලිපිකරුගේ විධානය යටතේ කාර්මික අංශය මගින් ගෙන යනු ලබන බව වාර්තා කර ගන්නා ලදි.

(4) සාන්ත කුම්බස් කම්හලට යෝජිත විශාල කිරීම්

සාන්ත කුම්බස් කම්හල ව්‍යාප්ත කිරීම සඳහා වූ පහළ ම ටෙන්ඩරය එවූ ඩබ්ලිව්. එම්. අප්පුහාමිගේ රුපි: 55,190.80 ටෙන්ඩරය බාර ගන්නා ලදි.

ජේ. එල්. කැපර් මහතා යෝජනා කරන ලදුව එස්. පී. වෛතිලිංගම් මහතා ස්ථිර කරනු ලැබ යෝජිත සංශෝධනයන්ට යටත්ව වාර්තා සම්මත විය.

## 5. 1965 ඔක්තෝබර් 2 වෙනි දින පැවැති අත්හද බැලීම් හා වතුයා කමිටු සභා රැස්වීම් වාර්තාව

(1) ෂන්මුගම් මහතාගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් පෝරියා මර්ධනය සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය පිළිබඳ ලඟදී ම ලිපියක් පළ කරන බව අධ්‍යක්ෂවරයා පැවසී ය.

(2) විශ්‍රාම දීමනා

විශ්‍රාම දීමනා ගෙවීම ඉතා දළ වශයෙන් පමණක් ගණන් බලා ඇති බවත් ඒවා ගෙවනු ලබන්නේ, ලංකා වතුයා සේවා සම්මේලනයේ ප්‍රමාණයන් අනුව බවත් විල්ඩසන් මහතාට පිළිතුරු වශයෙන් සිවරත්නම් මහතා පැවසී ය. අනාගතයේ දී නියත වශයෙන් විශ්‍රාම ගන්නා කම්කරුවන්ට පමණක් සෑහෙන පරිදි මේ දීමනා සකස් කරන ලෙස සිවරත්නම් මහතාගෙන් ඉල්ලා සිටින ලදි.

ජේ. එල්. කැපර් මහතාගේ යෝජනය එස්. පී. වෛතිලිංගම් මහතා ස්ථිර කරනු ලැබ සාන්ත කුම්බස් හා සාන්ත ජොයකිම් වතුයා වල 1966 ඇස්තමේන්තු හා අත්හද බැලීම් හා වතුයා කමිටු රැස්වීම් වර්තා සම්මත කරන ලදි.

## 6. 1965 නොවැම්බර් 12 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා

(1) ස්ථාවර වත්කම් ලේඛනය

කමිටුවේ නිර්දේශ මණ්ඩලය අනුමත කළ අතර ආයතනයේ ඉඩම් හා ගොඩනැගිලි රජයේ තක්සේරුකරු ලවා තක්සේරුකර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

(2) 1965 අගෝස්තු 31 වෙනි දිනට ගිණුම්

ලෝස් මහතාගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් 65.10.20 වෙනි දින 6 මාසයක කාල සීමාවක් සඳහා රුපි: 1,000,000 ක් ස්ථිර තැන්පත් මුදල් වශයෙන් යොදවන ලද බව ලේකම්වරයා පැවසී ය. ගිණුම් සම්මත විය.

(3) ප්‍රතිසම්මත වැය (රුපි. 112,700.39) වැය මාරු කිරීම (රුපි. 22,206.00) සහ පරිපූරක වැය (රුපි. 88,600.00)

ප්‍රති සම්මත වැය, වැය මාරුකිරීම හා පරිපූරක වැය සම්මත විය. ලෝස්, ෂන්මුගම් හා රාජෙන්ද්‍රම් යන මහතුන් විපක්ෂ විය.

මේ අවධියේ දී කැපර් මහතා රැස්වීමෙන් පිට විය.

(4) ආචාර්ය ඩී. කීර්තිසිංහ කර්මාන්ත ශිල්පඥ

1965 ඔක්තෝබර් 15 වෙනි දින සිට කර්මාන්ත ශිල්පඥ වශයෙන් ආචාර්ය ඩී. කීර්තිසිංහ මහතාගේ පත්වීම ස්ථිර විය.

**(5) සේවා කොන්දේසි**

තේ — පහත දැක්වෙන තේ දීමනා මණ්ඩලය අනුමත කළා ය:

| | | | |
|---|---|---|---|
| විවාහක නිලධාරීන් | බී. එම්. | රාත්. 2 | නොමිළේ |
| | බී.ඕ.පී. | රාත්. 1 | |
| අවිවාහක නිලධාරීන් | බී.එම්. | රාත්. 1 | නොමිළේ |
| | බී.ඕ.පී. | රාත්. 1 | |

මීට වඩා අවශ්‍ය ප්‍රමාණයන් වෙළෙඳ මිලට ලබා ගත හැකි ය.

**(6) එක්සත් රාජධානියේ විද්‍යා උපදේශක කමිටුවේ සාමාජික මාහාචාර්ය ජී. ඊ. බ්ලැක්මන්, එෆ්.ආර්.එස්.**

මහාචාර්ය බ්ලැක්මන්ගේ ගුවන් ගාස්තු ලන්ඩන්-කුවාලාලම්පූර් දක්වා මැලෙයාවේ රබර් පර්යේෂණ ආයතනය මගින් ගෙවන බව අධ්‍යක්ෂකවරයා පැවසී ය. ඔස්ට්‍රේලියානු විද්‍යා ශාස්ත්‍රීය ආයතනය සිංගප්පූරුවේ සිට ඔස්ට්‍රේලියාවටත් ආපසු කොළඹටත් ගමන් ගාස්තු ගෙවනු ඇත. කොළඹ සිට ලන්ඩනය දක්වා ගමන් ගාස්තු තේ පර්යේෂණායතනයට ගෙවන්නට සිදුවනු ඇත. පසුගිය වතාවේ ද පැමිණි විට විශාල වශයෙන් අපට උපකාර වූ ලෙස ම මහාචාර්ය බ්ලැක්මන් සාන්ත කුම්බස් සිටින සුළු කාලය විද්‍යා නිලධාරීන්ට විශේෂ උපකාරයක් වනු ඇතැ යි සභාපතිවරයා පැවසී ය. සාකච්ඡා කිරීමෙන් පසු මහාචාර්ය බ්ලැක්මන්ගේ කොළඹ සිට ලන්ඩනය දක්වා ගුවන් ගාස්තු ගෙවීම මණ්ඩලය අනුමත කළා ය.

**(7) 3 වන කරුණ—තේ. පර්. ආ. ක්‍රීඩා සමාජය**

ක්‍රීඩා සමාජය සඳහා වැඩි කරන ලද රුපි: 4,000.00 ක වාර්ෂික දීමනාවක් සම්මත විය. මේ ප්‍රමාණය 1966 ඇස්තමේන්තුවලට ඇතුළත් නොකරන ලද බව ද සඳහන් කර ගන්නා ලදි.

වෛතිලිංගම් මහතාගේ යෝජනය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කරන ලදුව පරිපාලන කමිටු සභා රැස්වීම් වාර්තා සම්මත විය.

## 7. නිලධාරී කටයුතු

**ආචාර්ය ෂන්මුගනාදන්**

1.1.1966 දින සිට ආචාර්ය එන්. ෂන්මුගනාදන් මහතා පාලැටි ව්‍යාධි විද්‍යා අංශයේ ප්‍රධානියා වශයෙන් පත් කිරීම පිළිබඳව වූ අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය අනුමත විය.

## 8. වෙනත් කරුණු

**(1) පත්වීම් හා ඉල්ලා අස්වීම්**

පහත දැක්වෙන දේ සඳහන් කර ගන්නා ලදි:

**(ආ) පත්වීම්**

ඒ. එස්. බී. ගෝමස් මහතා, කර්මාන්තඥ සහායක, පැළැටි ජනන අංශය, 1.10.65 සිට
එස්. ආර්. ප්‍රනාන්දු මහතා, කර්මාන්තඥ සහායක, පැළැටි ව්‍යාධි විද්‍යා අංශය, 1.10.65 සිට
ටී. ඒ. මුණසිංහ මහතා, කර්මාන්තඥ සහායක, කර්මාන්ත ශිල්ප අංශය, 1.11.65 සිට
ටී. මනිවාසගර් මහතා, කර්මාන්තඥ සහායක, කීට විද්‍යා අංශය, 1.12.65 සිට
එස්. විමලධර්ම මහතා, කර්මාන්තඥ සහායක, පැළැටි කායික විද්‍යා අංශය, 1.1.66 සිට

**(ආ) අස්වීම්**

කේ. ජී. ඒ. ධර්මවර්ධන මහතා, පර්යේෂණ සහායක, කර්මාන්ත ශිල්පාංශය, 1.10.65

**(ඇ) විශ්‍රාම ගැනීම**

එම්. පියසේන මහතා, දෙවු කර්මාන්තඥ සහායක, පැළෑටි කායික විද්‍යා අංශය, 31.1.66

වී. මෙන්ඩිස් මහතා, දෙවු කර්මාන්ත සහායක, කෘෂිකර්ම රසායන විද්‍යා අංශය, 31.1.66

එෆ්. ජී. ද සිල්වා මහතා, ප්‍රධාන ලසුහන්කරු, 31.1.66

**(ඈ) විදෙස් නිවාඩුවෙන් පසු පැමිණියහ**

ජේ. ඒ. එච්. ටොල්හර්ස් මහතා, කෘෂිකර්ම රසායනඥ, 29.9.65

ජේ. ඊ. ක්‍රානම් මහතා, කෘමි විද්‍යාඥ, 23.9.65

සී. බී. පොස්ටර් බාහම් මහතා, ප්‍රධාන උපදෙස් නිලධාරි, 4.10.65

**(ඉ) පශ්චාත් උපාධි පුහුණුවෙන් පසු පැමිණියහ**

ආචාර්ය ඩබ්ලිව්. දන්තනාරායන, පර්යේෂණ නිලධාරි, කෘමි විද්‍යා අංශය, 23.9.65

ආචාර්ය පී. සිවපාලන්, පර්යේෂණ නිලධාරි, කීට විද්‍යා අංශය, 19.11.65

විශ්‍රාම ලබන පහත දැක්වෙන නිලධාරීන් ආයතනයට කරන ලද ඉතා දීර්ඝ සේවය මණ්ඩලය අගය කරන බව සඳහන් කර ගන්නා ලදී.

එම්. පියසේන මහතා, පැළෑටි කායික විද්‍යා අංශය
අවුරුදු 35 ක සේවයෙන් පසු විශ්‍රාම ගැනීම

වී. මෙන්ඩිස් මහතා, කෘෂිකර්ම රසායන විද්‍යා අංශය
අවුරුදු 36 ක සේවයෙන් පසු විශ්‍රාම ගැනීම

එෆ්. ජී. ද සිල්වා මහතා, ප්‍රධාන ලසුහන්කරු
අවුරුදු 30 ක සේවයෙන් පසු විශ්‍රාම ගැනීම

**(2) මණ්ඩලයේ මුද්‍රාව**

පහත දැක්වෙන ලියවිලිවලට මණ්ඩලයේ මුද්‍රාව තබන ලද බව වාර්තා කරන ලදි:

(1) පෙම්බ්‍රෝක් බංගලාව මාරු කිරීම් ඔප්පුව
(2) මෙම බංගලාව මිළදී ගැනීම දැක්වෙන රිසිට්ටය
(3) හන්තාන හා පස්සර අතුරු ස්ථානවල ක්ෂුද්‍ර කම්හල් හැදීමේ ගිවිසුම
(4) ප්‍රාදේශීය උපදෙස් නිලධාරි පස්සර බංගලාව විශාල කිරීම පිළිබඳ ගිවිසුම්
(5) පස්සර ප්‍රාදේශීය උපදෙස් නිලධාරිට බැංකු ගිණුමක් විවෘත කිරීම දැක්වෙන ගිවිසුම

පහත දැක්වෙන ලියවිලිවලට මණ්ඩලයේ මුද්‍රාව තැබීම සම්මත විය.

| | | |
|---|---|---|
| (1) | ක්ෂෙත්‍ර වාර්තා කිරීම් කාමරය | —ඩබ්ලිව්. ඇම්. අප්පුහාමි |
| (2) | සාන්ත කූම්බ්ස් කම්හල විශාල කිරීම | — ,, |
| (3) | විද්‍යා ගබඩාව | — ,, |
| (4) | සුළු නිලධාරි නිවාස | — ,, |
| (5) | කාර්මික ගබඩාව | —එම්. වයි. හේමචන්ද්‍ර සහ සමාගම |
| (6) | කනිටු ශ්‍රේණි නිවාස | — ,, |

පස්වරු 2 ට රැස්වීම හමාර විය.

ඒ. සී. පෙරේරා,

ලේකම්.

මගේ අංකය: ඕඩී—5/52/6.
1967 මාර්තු මස 21 වැනි දින,
කොළඹ 7: රජයේ ගණන් පරීක්ෂක කාර්යාලයයේ දී ය.

සභාපති,
තේ පර්යේෂණ ආයතන මණ්ඩලය,
තලවාකැලේ.

## 1965 වර්ෂයේ තේ පර්යේෂණ ආයතනයේ ගිණුම් හා ගණන් පරීක්ෂණ වාර්තාව

1961 අංක 57 දරන තේ පර්යේෂණ (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද තේ පර්යේෂණ ආඥා පනතේ (438 අධිකාරය) 13 (3) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම, ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පත් කරන ලද ගණන් පරීක්ෂකයින් වන ෆෝර්ඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම විසින්, 1965 වර්ෂයේ තේ පර්යේෂණ ආයතනයේ ගිණුම්, මගේ විධිවිධාන යටතේ, පරීක්ෂා කරන ලදි. 1961 අංක 57 දරන පනතේ 13 (7) දරන වගන්තියෙන් අවශ්‍ය කර ඇති පරිදි, 1965 දෙසැම්බර් 31 වැනි දින ශේෂ පත්‍රය හා ගිණුම් ප්‍රකාශ ද ගණන් පරීක්ෂකයින්ගේ වාර්තාව ද මෙ සමග ඉදිරිපත් කරමි.

### 2. ස්ථාවර වත්කම්—රු: 1,27,60,077

අදාල විස්තර සමග ස්ථාවර වත්කම්, ලේඛනය පවත්වා නැති නිසා, ඉකුත් වර්ෂවල මෙන් මේ වර්ෂයේ ද මෙම විෂය යටතේ පෙන්නුම් කරන දෑයේ නිවැරදිතාවය තහවුරු කිරීමට ගණන් පරීක්ෂකයින්ට නුපුළුවන් විය. වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයක් මගින් හරි වැරදි බැලීම් වස් දැනට සකස් කර ගෙන යන ලේඛනය ඉක්මණින් ලියා අවසන් කළ යුතුව ඇත.

### 3. පොදු සහ විදුලිබල උපකරණ තොග—රු: 1,97,786

1965 තුළ දී ලැබෙන ලද හා නිකුත් කරන ලද මෝටර් වාහන අමතර කොටස් දක්වෙන ලේඛන තබා නැත. තව ද, අනෙක් ගබඩා විෂයයන් සම්බන්ධයෙන් වර්ෂය අග දී නිරීක්ෂණයවල ලද හරි වැරදි බලන ලද ශේෂය හා පොතේ දක්වෙන ශේෂය අතර වූ වෙනස ගලපා නැත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තොගවල වටිනාකම හරි හැටි ගිණුම්වල පෙන්නුම් කර නැත. මේ කරුණු සම්බන්ධයෙන් පාලක පක්ෂය විසින් සම්මත ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතුව ඇත්තේ ය.

### 4. අයභාරයට අය කරන ලද මූලධන වියදම්

ගෘහභාණ්ඩ, විද්‍යාත්මක උපකරණ ආදිය වෙනුවෙන් දරන ලද රු.26,614 ක වියදමක් මූල ධන වැය සම්මතයන්ට අය කර මූලධනගත කරනවා වෙනුවට අය භාරයට හරකර ඇත්තේ ය. ඒ නිසා, ගිණුම්වල නිවැරදි තත්ත්වය එතෙක් දුරට පෙන්නුම් නොකෙරේ.

### 5. විවිධ ණය ගැතියෝ—රු: 9,37,570

අප්‍රමාදව සම්මත ක්‍රියා මාර්ගයක් නොගතහොත්, රු: 3,377 වටිනා ණය මුදල අය කර ගැනීම සැක සහිත බව පෙනේ.

### 6. විවිධ ණය හිමියෝ—රු: 3,29,192

ලෙජර් ශේෂ හා ණය හිමියන් විසින් සනාථ කරන ලද ශේෂ අතර රු: 1,66,497 ක වෙනසක් ඇති බව නිරීක්ෂණය විය. මේ වෙනස් කම සඳහා ගිණුම් පොත් පත් ගලපා ද නැත. මේ කාරණය නිසා විවිධ ණය හිමියන් වශයෙන් පෙන්වා ඇති මුදලින් නිවැරදි තත්ත්වය පෙන්නුම් නොකෙරේ.

### 7. අභ්‍යන්තර ගණන් පරීක්ෂණය:

අභ්‍යන්තර ගණන් පරීක්ෂණාංශය සංවිධානය කිරීමේ අවශ්‍යතාවය මගේ පසුගිය වාර්තාවෙන් අවධාරණයෙන් ම දැනටමත් දන්වා ඇත. අභ්‍යන්තර ගණන් පරීක්ෂණ කටයුතු ජ්‍යෙෂ්ඨ නිලධාරියකුට පැවරීම් වස් අවශ්‍ය කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බැව් පෙනේ.

8. ගණන් පරීක්ෂකයින්ගේ වාර්තාවේ සඳහන් දැනට පවත්නා අභ්‍යන්තර පාලනයේ දුබලතාවයන් හා ගිණුම්වල ඇති අඩු පාඩු කම් පිළිබඳව මණ්ඩලය විසින් වහා ප්‍රතිකර්ම කිරීම මැනවි.

ඒ. පී. බෙමුණුගේ
ඔඩිටර් ජනරාල් වෙනුවට

ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති තුමා,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය,
අංක 330, යූනියන් පෙදෙස,
කොළඹ 2.

ප්‍රිය මහත්මය,

## 1965 දෙසැම්බර් 31 වෙනිදයින් අවසන් වන වසර සඳහා පරික්ෂිත ගිණුම්

පරික්ෂිත ගිණුම් වාර්තාවත්, ඔඩිටර් ජෙනරාල් තුමාගේ අංක ඩීඩී—5/52/6 හා 1967 මාර්තු 21 දතම ලිපිය පිළිබඳවත් මගේ අදහස් මෙසේ ය.

**1. 66.12.31 දතම ගණන් පරික්ෂකවරුන්ගේ වාර්තාව**

**(1) දෙවන ඡේදය—ii මණ්ඩලයේ නීති**

කෙටුම්පත් කොට ඇති නීති මාලාව දැනට මණ්ඩලයේ අතුරු කමිටුවක් මගින් සියුම් ලෙස පරික්ෂා කර ගෙන යයි. එය යථා කාලයේ දී අනුමතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ඇත.

**2. තුන්වන පිට (ii) සුළු ණය හිමියෝ**

**(අ) ප්‍රකාශණ සඳහා ග්‍රාහක මුදල්**

කලින් ගෙවනු ලබන මුදල් හැම වර්ෂයක ම ග්‍රාහක පත්‍රවල ඇතුළත් කළ යුතුය යන ගණන් පරික්ෂකවරුන්ගේ උපදේශය 1967 සිට අනුගමනය කරනු ලැබේ.

**3. හතරවන පිටුව (ආ) සුළු සැපයුම්කරුවෝ**

ගෙවිය යුතු ප්‍රමාණයන් වශයෙන් අප ගිණුම්වල පෙනෙන ශේෂයන් සමහර සුළු සැපයුම්කරුවන් ගෙන් ලැබුණු ස්ථිර කිරීමේ ප්‍රකාශයන් හා නොගැලපුනේ 1965 දී ගනු ලැබූ භාණ්ඩ සඳහා 1966 ජනවාරියේ දී අප විසින් ගෙවූ චෙක්පත්, 1965 ගිණුම් සඳහා ඔවුන් ඇතුළත් නොකිරීම ය. මේ ශේෂයන්ගේ වෙනස පිළිබඳ සැසඳුම් ප්‍රකාශයක් අප ගණන් පරික්ෂකවරුන් වෙත යවා ඇත.

**4. පස්වන පිටුව ලංකා ඛනිජ තෙල් සංස්ථා ගිණුම**

ලංකා ඛනිජ තෙල් සංස්ථා ගිණුම දැන් බේරුම් කොට ඇත.

**5. 6 වන පිටුව (ඇ) රැඳි මුදල්**

මෙහි දක්වා ඇති රැඳි මුදල් පහතරට ස්ථාන ගොඩනැගිලි කොන්ත්‍රාත් සම්බන්ධව ය. ඒ පිළිබඳ විමසීම් කර ගෙනයේ.

**හය වන පිටුව (ඉ) පහතරට ස්ථාන සමුච්චිත විශ්‍රාම වැටුප් රුපි. 8124/-.**

මෙම මුදල සමුච්චිත අරමුදල් ගිණුමට මාරු කොට ඇත.

**6. හත්වන පිටුව—(iv) ස්ථාවර වත්කම්**

ස්ථාවර වත්කම් ලේඛනය සූදනම් කොට අවසාන ය. එය ගණන් පරික්ෂකවරුන් විසින් පිරික්සනු ලැබේ.

පහතරට ස්ථාන ප්‍රාග් ධන වැය අනු කොටස්වලට බෙදීම කර ගෙන යේ. එය මෙම වසරේ දී සම්පූර්ණ කරනු ඇත.

**7. අටවන පිටුව—(ii) ප්‍රාග්ධනිත කොට ඇති කරුණුවල ස්වරූපය**

අප ගණන් පරික්ෂකවරුන්ගේ 67.5.1 දතම ලිපියෙහි එන අදහස් ක්‍රියාවට නඟනු ඇත.

ප්‍රාග්ධනීත කරනු ලබන භාණ්ඩ පිළිබඳ ලියවිලි තැන්පත් කිරීම සඳහා 1967 ජනවාරියේ සිට වෙන ම ලිපි ගොනුවක් පවත්වා ගෙන යේ.

**8. නවවන පිටුව—(ඇ) ස්ථාවර වත්කම් විකිණීම**

තේ ඇඹරුම් යන්ත්‍රය සඳහා ගෙවූ මුල් මිල දැනගැනීමට අපහසු ය. ඒ නිසා වෙනස් කිරීමක් ඇති කිරීම අපහසු ය. මෙම ප්‍රමාණය අධිකතා ගිණුමට පවරනු ඇත. තවිමරණ දෙණිකාවේ ක්ෂය ප්‍රමාණය වන රුපි. 2,301/09 අධිකතා ගිණුමට පවරනු ඇත.

**9. (ඊ) ගෘහ නිර්මාණ ශිල්පි ගාස්තු**

මෙම ගිණුම දැන් බේරුම් කොට ඇත.

**10. නවවන පිට—බඩු තොග**

1966 යේ ගිණුම් අවසාන කරන විට මේ වෙනස්වීම් ඇතුලු කරනු ලබන අතර යථා කාලයේ දී මණ්ඩල අනුමතිය ගනු ඇත. ගණන් පරීක්ෂකයන් ඉල්ලා ඇති පරිදි 66.12.31 වෙනි දිනට ඇති ලිපි ද්‍රව්‍ය තොගයෙහි වටිනාකම 1966 ගිණුම්වල දක්වෙනු ඇත.

**11. එකොළොස්වන පිටුව—(8) (අ) ණය කරුවෝ; අනෙක් ණය ශේෂය**

රුපි. 3,376.67 කට එකතු වන ණය ප්‍රමාණය පිළිබඳ තත්වය මෙසේය.

| | |
|---|---|
| සුළු සේවක සංගමය (පසුව අය කර ගත්) ... ... | රුපි. 4.05 |
| 66.12.12 දින මණ්ඩලයේ අනුමතිය ඇතිව ලියා හල ණය තුරුස්... | රුපි. 1,008.66 |
| දැනට වෙනස් කොට ඇති, වැරදි සහිත සටහන් ... ... | රුපි. 2,123.52 |
| | රුපි. 3,136.23 |

පහත දක්වෙන ණය පිළිබඳ කරුණු විමසා ගෙන යේ.

| | |
|---|---|
| මට්ටකැලේ වතුයාය ... ... ... ... | රුපි. 232.54 |
| එච්. එන්. හැසලෝ ... ... ... ... | රුපි. 7.90 |
| | රුපි. 240.44 |

**12. එකොළොස් වෙනි පිටුව—(ආ) කාර්ය මණ්ඩල ණය**

හිටපු සේවකයන් ගෙන් ලබා ගත යුතු රුපි. 1,248.85 පිළිබඳ තත්වය.

| | |
|---|---|
| ජී. ඩී. ඔස්ටින් මහතාගේ ණය මණ්ඩලය 66.12.12 වෙනි දින ලියා හරින ලදි. ... ... ... ... | රුපි. 33.59 |
| පසුව අය කර ගත් ... ... ... ... | රුපි. 1,215.35 |
| | රුපි. 1,248.85 |

**13. එකොළොස්වන පිටුව—(ඇ) බූමිතෙල් උඳුන් සඳහා අත්තිකාරම් මුදල්**

66.12.12 දින පැවති මණ්ඩල රැස්වීමේ දී රුපි. 25.02 ක මුදලක් ලියා හැරීමට එකඟ වූවා ය.

**14. දෙළොස්වන පිටුව—නිලධාරි අයකර ගැනීම් ගිණුම**

ගණන් පරීක්ෂකයන්ගේ අදහස් පරීක්ෂා කර ගෙන යේ. අධි ගාස්තුවක් වූ රුපි. 1.45 ක මුදල දැන් ගලපා ඇත.

**15. දෙළොස්වන පිටුව—(9) තැන්පත් මුදල්**

රුපි. 30 ක මුදලක් වැරදීමකින් තැන්පත් මුදලක් හැටියට පෙන්නුම් කොට ඇත. මෙම මුදල 4.1.14 වන දින ගෙවන ලද අතර දැන් එය ගලපා ඇත.

සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් (රු. 150/-) හා ඩී. ජී. ඊ. යූ. (රු. 3.741) ගිණුම දැන් ගලපා ඇති අතර තව දුරටත් ඒවා තැන්පත් මුදල් වශයෙන් නොදක්වේ.

**16. පහළොස් වන පිටුව—(4) ඇස්තමේන්තු**

කෙටුම් ගිණුම් පිළියෙල කරන විට දී වැය ලෙජරය අනුව අය වියදම් නොවී ය. ගිණුම් පරීක්ෂණයේ දී ගණන් පරීක්ෂකයන් විසින් ගැලපීම් කිහිපයක් කරන ලදි. අය වියදම් පහළ වූයේ මෙවිට ය.

**17. දහසය වන පිටුව—6 වන කරුණ ප්‍රාග්ධන වියදම් අයට බැර කිරීම**

1966 දී අයට බැර කරන ලද දේ සියුම් ලෙස පරීක්ෂා කරන ලදී. ප්‍රාග්ධනික කළ යුත්තේ කිනම් වර්ෂයේ වියදම් ද යන වගට 67.1.5 දරණ ලිපියෙන් ගණන් පරීක්ෂකවරුන් අනුමතිකම් දී ඇත.

**18. දහහත් වන පිටුව—6 වන කරුණ:අභ්‍යන්තර පරීක්ෂණය**

අභ්‍යන්තර ගණන් පරීක්ෂණය පිළිබඳ අවුරුදු 24 ක පලපුරුද්දක් ඇති අයකු පළමු ශ්‍රේණියේ වැටුප් පරිමාවෙහි 67.3.1 දින සිට පත් කොට ඇත.

**19. දහනවවන පිටුව—(8) මාර්ගස්ථ බඩු**

1966 නොවැම්බරයේ සිට ගණන් පරීක්ෂකවරුන්ගේ උපදෙස් පරිදි මාර්ගස්ථ බඩු ගිණුමක් මෙහෙය වේ.

**ii. 67.3.21 දතම ඔඩිටර් ජෙනරාල්තුමාගේ ලිපිය**

**20. දෙවන ඡේදය—ස්ථාවර වත්කම් ලේඛනය**

කරුණාකර ඉහත දැක්වෙන 6 වන කරුණ බලන්න.

**21. පොදු බඩු තොග**

විශේෂ ලේඛනයක් දැන් පවත්වා ගෙන යනු ලැබේ.

**22. 5 සුළු ණය කරුවෝ**

කරුණාකර ඉහත සඳහන් (ii) බලන්න.

**23. 6. සුළු සැපයුම්කරුවෝ**

කරුණාකර ඉහත සඳහන් (3) බලන්න.

**24. අභ්‍යන්තර ගණන් පරීක්ෂණය**

කරුණාකර ඉහත සඳහන් (18) බලන්න.

ගණන් පරීක්ෂකවරුන්ගේ වාර්තාවෙහි සඳහන් වන ගිණුම්වල ඇති දුර්වලකම් ද දැනට පැවැත්වෙන අභ්‍යන්තර පාලනයේ අඩු ලුහුඩුකම් පිළිබඳවද මණ්ඩලයේ අවධානය යොමු වේ.

විශ්වාසී,

**එෆ්. අමරසූරිය,**
සභාපති,
ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලය

ෆ්පෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම,

තැ: පෙ: අංක 186
කොළඹ.

**පෞද්ගලික හා රහස්‍යයි**

ඔඩිටර් ජනරාල්,
කොළඹ.

1966 දෙසැම්බර් 31

ප්‍රිය මහත්මය,

## 1965 දෙසැම්බර් 31 වෙනිදයින් අවසන් වන වසර සඳහා ලංකා තේ පර්යේෂණායතනයේ ගිණුම්

ඉහත ගිණුම් පරීක්ෂණය අප විසින් අවසාන කොට ඇති අතර මෙම වාර්තාවට පහත දැක්වෙන ප්‍රකාශයන් ඇතුළත් කරමු:—

1. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය හා ඒ පිළිබඳ අප වාර්තාව.
2. (අ) සාන්ත කූම්බ්ස් වතුයාය
   (ආ) සාන්ත ජෝයකිම් වතුයාය
   සම්බන්ධ 1965 දෙසැම්බර් 31 වෙනි දිනට අවසාන වන කාරක ගිණුම.
3. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට අවසාන වන වසර සඳහා අය-වැය ගිණුම.
4. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ණය හිමියන් හා ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය.
5. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට මිළ, සමුච්චිත ක්ෂය, අඩු කළ අගය පෙන්නුම් කෙරෙන ස්ථාවර වත්කම් සාරාංශය.
6. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ආයෝජනයන්ගේ සාරාංශය.
7. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට අතැති බඩු තොග සාරාංශය.
8. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ණයකරුවන් හා ණය ශේෂය පිළිබඳ සාරාංශය.
9. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ණය ගැති නිලධාරීන් පිළිබඳ සාරාංශය.
10. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට තැන්පත් මුදල් පිළිබඳ ප්‍රකාශය.
11. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට අතැති මුදල් හා බැංකු ශේෂය පිළිබඳ සාරාංශය.
12. 1965 දෙසැම්බර් 31 වෙනි දිනින් අවසාන වන වර්ෂයේ ආදායම් ගිණුමෙහි වියදම් විස්තරය.

### I. වසරෙහි ප්‍රතිඵලය

අවුරුද්දෙහි ප්‍රතිඵලයක් වූයේ රුපියල් 864,044.37 ක ක්ෂය ප්‍රමාණයක් බැඳීමෙන් පසුව රුපි: 837,439.03 ක අධිකයක් ඇතිවීම ය. අධිකය මෙසේ සැදිණ.

| | |
|---|---|
| ආයතනය—වියදමට අධික ආදායම ... ... | රු: 472,195.53 |
| සාන්ත කූම්බ්ස් වතුයාය—පවත්වා ගෙන යෑමේ අධිකය ... | රු: 287,862.03 |
| සාන්ත ජෝයකිම් වතුයාය—පවත්වා ගෙන යෑමේ අධිකය ... | රු: 77,381.47 |
| | රු: 837,439.03 |

මෙ හා සමාන පසු ගිය වසරේ අධිකය රුපි: 1,097,221.29 කි. ක්ෂය සඳහා රුපි: 615,089 ක් වෙන් විය.

## II. මණ්ඩල නීති රීති

මණ්ඩල නීති කෙටුම් පතක් අපි දැක්මු. මෙම නීති නීතිඥයන් විසින් අනුමත කොට ඇති අතර ලඟදී ම මණ්ඩලය විසින් අනුමත කිරීමට ද නියමිත ය. නීති ක්‍රියාත්මක කිරීමට පෙර පාර්ලිමේන්තුව මගින් අනුමත කළ යුතු වේ.

## III. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය

### 1. සමුච්චිත අරමුදල

වසර තුළ මෙම අරමුදලෙහි වෙනස්වීම් මෙසේ විය.

| | | | |
|---|---|---|---|
| | 1964 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය ... | | රු: 13,113,812.73 |
| එකතු: | ආයෝජනයන් වැය මිළට අනාවරණය කිරීමෙන් අගය වැඩි වීම ... ... ... | | 39,383.90 |
| | වසර තුළ වියදමට වැඩි ආදයම ... ... | | 837,439.03 |
| | | | 13,990,635.66 |
| අඩු: | ස්ථාවර වත්කම් විකිණීමෙන් පාඩුව ... | 6,022.92 | |
| | පසු ගිය වසර සම්බන්ධ නිවැරදි කිරීම් | 4,360.54 | 10,383.46 |
| | | | 13,980,252.20 |

පසුගිය වසර සම්බන්ධයෙන් කෙරුණු වෙනස් කිරීම් මෙසේ ය.

| | |
|---|---|
| 1964 ප්‍රසාද මුදල්—සාන්ත කුම්බ්ස් ... ... රු: | 6,875.00 |
| ගණන් පරීක්ෂක ගාස්තු—සාන්ත ජොයකිම් වතුයාය ... | 1,721.75 |
| පසුගිය වසරේ අඩුවෙන් වෙන් කිරීම ... ... | 4,641.10 |
| ගමන් ගාස්තු ... ... ... ... | 221.00 |
| ලියා අත්හළ තැන්පත් මුදල්—ලංකා ඔක්සිජන් සමාගම ... | 550.00 |
| විවිධ වෙනස්වීම් ... ... ... ... | 1.27 |
| | 14,010.12 |
| අයකර ගැනීම් ගිණුමෙහි වෙනස... ... ... | 1,808.17 |
| නැවත ලියන ලද ණය ශේෂය ... ... ... | 7,841.41 |
| | 9,649.58 |

| | |
|---|---|
| පසු ගිය වසර සම්බන්ධ සම්පූර්ණ වෙනස් කිරීම ... | 4,360.54 |

සාන්ත කුම්බ්ස් වතුයාය සේවකයන්ට ගෙවූ ප්‍රසාද දීමනා 1965 ජුනි 21 වෙනි දින මණ්ඩලය අනුමත කළා ය. නැවත ලියන ලද ණය ශේෂය, පසුගිය වසරේ වැය සඳහා වැඩියෙන් වෙන් කරන ලද ප්‍රමාණයෙන් ද බඩු තොග ගිණුමෙහි රුපියල් 2,429.12 කින් ද සෑදේ.

### 2. සුළුණය හිමියෝ

මේ යටතේ ඇතුළත් කොට ඇති දෙයට පහත සඳහන් දේ ඇතුළත් වේ.

#### (අ) ප්‍රකශන සඳහා ග්‍රාහක මුදල්—කලින් ලද මුදල රුපි: 5,946.05

1965 මාර්තු 5 වෙනි දින මණ්ඩලය ප්‍රකාශනයන් සඳහා දේශීය ගාස්තු රුපි: 15 සිට රු: 24 දක්වාත්, විදේශ ග්‍රාහක ගාස්තු රුපි: 16.56 සිට රු: 29.81 දක්වාත් වැඩි කළා ය. කෙසේ වුව ද කලින් ගෙවා තිබූ සමහර ග්‍රාහක ගාස්තු පරණ ප්‍රමාණයට ම විය. මුදලින් ගෙවනු ලබන ග්‍රාහක මුදල් සඳහා, ග්‍රාහක මුදල් ගෙවූ දිනය පෙන්නුම් කෙරෙන පත්‍ර මෙහෙය වනු ලැබේ. අප විසින් නිරීක්ෂණය කරන ලද බොහෝ පත්‍ර යථා පරිදි මෙහෙයවා

ඇති බව පෙනින. ගෙවන ලද ග්‍රාහක මුදල් සඳහන් නො වූ තැන් ස්වල්පයක් දැක ගත හැකි විය. මේ පිළිබඳව විමසන ලදුව මේවා අවුරුදු කිහිපයක් සඳහාම කලින් ගෙවන ලද ග්‍රාහක මුදල් බව අපට දන්විණ. මෙවැනි ගෙවීම් ද පත්‍රවල සටහන් කර ගත යුතු බව අපි නිර්දේශ කරමු.

**(ආ) සුළු සැපයුම් කරුවෝ—රුපි: 329,192.35**

පසු ගිය අවුරුද්දේ මෙන් ම මෙම වසරේ ද පරීක්ෂණයට සූදානම් කොට තිබූ ගිණුම් පත් හි රුපි: 278,370.36 ක් වූ ණයකුරුස්වලට ඉඩ කඩ නොසලසා තිබුණි. මෙම ඌනතාව මග හැරෙන පරිදි දැන් ගිණුම් සකස් කොට ඇත. මෙයට හේතුව පසු ගිය වසරේ තිබූ හේතුවම ය. වැය ලැජරය නිසි පරිදි ගෙන යා නැත. වැය වූ වියදම් නිසි තීරුවල ඇතුළත් කොට නැත. "ගෙවූ දින" තීරයෙහි දැක්වෙන්නේ ඉන්වොයිසියන් ගිනුමට ගනු ලැබූ දිනයයි. කෙසේ වුව ද 1966 දී වැය ලෙජරය නිසි පරිදි ගෙන යන බව අපට දක්ක හැකි විය.

නිවැරදි ශේෂය සනාථ කොට දන්වා එවන ලෙස ඉල්ලා යවන ලද ණය හිමියන් දැක්වූ සහයෝගය මෙසේ විය.

| | ගිණුම් ගණන | මුදල |
|---|---|---|
| චක්‍රලේඛිත මුළු ප්‍රමාණය | 70 | රුපි: 222,601.94 |
| සනාථ කිරීම් ලද ගණන | 48 | රුපි: 211,045.70 |
| සනාථ කෙරුණු % | 68.6 | 94.8 |

පහත සඳහන් අයගෙන් ලැබුණු ප්‍රකාශ ආයතනයේ ගිණුම්වල පෙනෙන ප්‍රමාණයන් හා නොසැසඳිණ.

| | 65.12.31 වෙනි දිනට ගෙවිය යුතු ශේෂය | සනාථ කළ ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු: ශ. | රු: ශ. | රු: ශ. |
| ෂෙල්ටන් සහෝදරයෝ ... | 17,908.30 | 17,980.30* | 72.00 |
| වොකර් සහ ග්‍රෙග් සමාගම ... | 6,802.04 | 8,584.48* | 1,782.44 |
| සීමාසහිත හේලීස් ... ... | 304.00 | 338.20* | 34.20 |
| වොලීස් ... ... ... | 13.30 | 198.55* | 185.25 |
| සීමාසහිත ඊ. බී. ක්‍රිසි සහ සමාගම ... | 2,368.02 | 7,375.80* | 5,007.78 |
| සීමාසහිත වෝකර් සහ පුත්‍ර සමාගම... | 95,294.32 | 248,572.94* | 153,278.62 |
| සීමාසහිත එංජිනියරින් සර්විසස් ... | 14,008.97 | 13,833.97– | 175.00 |
| සීමාසහිත කොලට්ස් ... ... | 565.03 | 1,306.86* | 650.83 |
| රක්ෂණ සංස්ථාව ... ... | 12,134.06 | 12,040.91– | 93.15 |
| නුවරඑළිය ඉලෙක්ට්‍රිකල් ඉංජිනියර්ස්. | 5,656.90 | 11,310.50* | 5,753.60 |
| | 155,045.95 | 321,542.51* | 166,496.57 |

ඉහත දක්වා ඇති වෙනස ඇති වීමට හේතු සෙවීමට කිසිම වැයමක් නොකරන ලද බව පෙනේ. එතෙකුදු 1966 වසර අවසාන භාගයේ දී සීමාසහිත වෝකර්ස් පුත්‍ර සමාගම හා ගිණුම තුලනය කළ බව අපට දන්වන ලදී.

අප පැමිණීමට පසුව ඉහත දක්වා ඇති වෙනසට (වොකර් පුත්‍ර සමාගම හැර) හේතු දක්වන ලද නමුත් ඒවායේ නිරවද්‍යතාවය සෙවිය නො හැකි විය.

ආයතනයත් ලංකා ඛනිජ තෙල් සංස්ථාවත් අතර ඇති භේදය තවමත් නිරාකරණය කළ නො හැකි විය. මෙම ප්‍රශ්නය තවමත් සාකච්ඡාවට භාජනය වී පවතින අතර, 1962, 1963, 1964 දී පමණ යැවුණු ඉන්වොයිසියන් ස්වල්පයක් සඳහා වූ රුපි: 2,295.75 ක් හැරෙන්නට අනෙක් මුදල් සම්බන්ධයෙන් 1966 ඔක්තෝබරයේ දී එකඟත්වයකට පැමිණිය හැකි විය. ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු ණයකුරුස් පියවීමට 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ගිණුම් හි වෙන් වූයේ රුපි: 10,204.90 ක් පමණ ය. මෙය ප්‍රමාණවත් නොවේ. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ඇති තොග ඇතුලුව බොහෝ මිළ දී ගැනීම් ඇතුළත් කොට නැති බව අපට පෙනිණ. අඩුවෙන් වැය වෙන් කොට ඇති ප්‍රමාණය අපට නිශ්චය කළ නොහැකි විය.

1965 දෙසැම්බර් 31 වෙනි දිනට අයවිය යුතු ශේෂය සනාථ කෙරෙමින් බ්‍රවුන් සහ සමාගමෙන් සනාථ කිරීමක් නොලැබිණ. මේ මතභේදය දුන් සම්මුතියකට පත් කොට ඇති බවත් ගිණුම්වල දක්වා ඇති රුපි: 7,025 ක මුදල මෙම වසරේ දී සමුච්චිත අරමුදලට පවරන බව ද ප්‍රධාන පරිපාලක නිලධාරි පැවසී ය.

**(ඇ) ටෙන්ඩර් තැන්පත් මුදල් රුපි: 370**

මෙම ගිණුමට ඇතුළත් වන්නේ රුපි: 30 ක් දක්වා ටෙන්ඩර්කරුවන් වෙත ආපසු ගෙවිය නොයුතු මුදල් ය. මෙය ද මෙම වසරේ දී සමුච්චිත අරමුදලට පවරණ බව අපට පවසන ලදි.

**(ඈ) රැඳි මුදල්—රුපි: 1,213.41**

මෙම මුදල 1963 සිට ම ඒ. මෙය මේ ගිණුමෙන් ඉවත් කළ යුතුව තිබුණි. අවුරුද්ද තුළ කොන්ත්‍රාත් කිහිපයක් අවසාන වූ නමුත් ඒ හැම එකක් සම්බන්ධයෙන් ම රැඳි මුදල් රඳවා නොතිබුණි. 1966 දී වැඩ ලේඛනයක් ඇති කිරීමත් සමඟ මෙම ප්‍රශ්නය අනාගතයේ දී මතු වෙතැයි සිතිය නොහැකි ය.

**(ඉ) පහත රට අතුරු ස්ථානය, පරිවර්තිත විශ්‍රාම දීමනා—රුපි: 8,124**

තාවකාලික මාසික දීමනා ලබන වැඩ නොකරන කම්කරුවන් 16 දෙනකු සඳහා සාන්ත ජොයකිම් වතුයාය පවරා ගැනීමේ දී සීමාසහිත ජෝජ් ස්ටුවට් සහ සමාගම විසින් ගෙවන ලද පරිවර්තිත විශ්‍රාම දීමනා මෙම ගිණුමෙන් නිරූපණය වේ. දීමනා සඳහා ගෙවන ලද මුදල් වැයට ගිණුම් ගෙන ඇති හෙයින් මෙය පවරා ගැනීමේ වියදම් වශයෙන් හෝ සමුච්චිත අරමුදලට පවරන ලෙස හෝ අපි සඳහන් කරමු.

**(ඊ) ස්ටාරි අන්තිම කැමැත්ත—රුපි: 5,310.17**

ඊ. ජේ. ස්ටාරිගේ දේපළ පොල්මෑකාරයන් විසින් තෑගි කළ දෙයින් 1966 දී පහත දැක්වෙන පොත් මිළ දී ගෙන ඇත.

ගෝල්ඩන් ට්‍රිජ්ස් — සිලිම් 50 යි
එක්ස්ඹිටිකා — එකක් රුපි: 247.50 බැගින් පොත් තුනක්

**(3) රජයේ ණය—රුපි: 1,833,333**

රජයෙන් ලද පොලී විරහිත ණය සම්බන්ධ ශේෂය තහවුරු කෙරෙමින් අපට සහතිකයක් ලබා ගත හැකි විය.

**(4) ස්ථාවර වත්කම්**

**(අ) හරි වැරදි බැලීම**

අයිති වත්කම්වල හිමිකම අප විසින් පිරික්සන ලදි. වතුයා දෙකෙහි ඔප්පුත්, ආයතන සතු වාහන ලියා පදිංචි කළ සහතිකත් පිරික්සුමෙන් මේවායේ අඩු කළ වටිනාකම රුපි: 2,156, 861.74 ක් විය. ගැනලාම හරි වැරදි නොබැලූ අනෙක් වත්කම්වල වටිනාකම රුපි: 10,603,215.33 ක් විය.

පසුගිය වාර්තාවෙන් අප නිර්දේශ කළ ස්ථිර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යැමේ කටයුතු දැන් සූදනම් වෙමින් පවතී. එක එක දෙපාර්තමේන්තුව සතු වත්කම් ලේඛනයක් සකස් කොට ඇති බවත් දැන් කළ යුතුව ඇත්තේ විකුණුම් මිළ නොදත් මේ වත්කම් තක්සේරු කිරීම පමණැ යි අපට දන්වන ලදි.

ස්ථාවර වත්කම් ලේඛනය සූදනම කිරීම සම්බන්ධයෙන් අප සමඟ වූ සාකච්ඡාවල දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ව්‍යාකූලභාවයක් පවතින බව අපට පෙනී ගියේ ය.

**(i) ලෙජර ගිණුම් සමඟ එකඟත්වය**

දැනට භාවිතා වන විවිධ වත්කම් වාර්තා කර ගැනීම සඳහා ගිණුම් 29 ක් ගෙන යනු ලැබේ. උදා: ජල සැපයුම, දෙවු නිලධාරී නිවාස, අන්තර්මධ්‍ය නිලධාරී නිවාස ආදිය. සාන්ත ජොයකිම් වතුයාය, හන්තාන, පස්සර හා කොට්ටාව අතුරු ස්ථානවල ඇති විවිධ වත්කම් සඳහා වෙන ම ගිණුම් හතරක් මෙහෙය වනු ලැබේ. මෙම වත්කම්වල ලේඛන

ගත වටිනාකම ලෙජරයෙහි පෙනෙන ශේෂයන් හා සැසඳිය යුතු හෙයින් වත්කම් වාර්තා කෙරෙන කාඩ්ස් පත්‍ර ලෙජර් ගිනුම අනුව කැටි කොට එකතු කළ යුතු යැයි අපි අදහස් කරමු. අධිකයන් හෝ ඍණයක් ඇතොත් ඒවා නැවත තක්සේරු කිරීම් ගිණුමක් මගින් තුලනය කළ යුතුයි.

### (ii) ධන භාණ්ඩ වශයෙන් ගොනු කරන භාණ්ඩවල ස්වරූපය

ධන භාණ්ඩ වශයෙන් ගොනු කළ යුත්තේ කිනම් වර්ගයේ භාණ්ඩ දැයි ආයතනයේ නිලධාරීන්ට නිශ්චය අදහසක් නොමැත. භාණ්ඩයක් ප්‍රාග්ධන හෝ ආදායම් වශයෙන් ගොනු කිරීමේ දී සැලකීමට භාජනය කළ යුතු සාධක දක්වමින් මණ්ඩලය වෙත අප විසින් වෙන ම ලිපියක් ඉදිරිපත් කොට ඇත.

ස්ථාවර වත්කම් ලේඛනය සූදනම් කිරීමෙන් පසුව එහි නිරවද්‍යතාවය සෙවීමටත් එය අනූනව සම්පූර්ණ කිරීමටත් කිසියම් පිළියෙලක් අනුගමනය කළ යුතු ය. ප්‍රාග්ධනිත භාණ්ඩයනට අදළ වන ලිපි වෙන ම තැන්පත් කොට තැබිය යුතු යැයි මේ සම්බන්ධයෙන් අපි අදහස් කරමු.

#### (ආ) ඇස්තමේන්තු

පසුගිය වසරේ මෙන් ම ප්‍රාග්ධනනය කළ භාණ්ඩ අයිති ගිණුමත් ඇස්තමේන්තුත් අතර හරස් යොමු කිරීමක් නොවී ය. 1967 ඇස්තමේන්තු සූදනම් කිරීමේ දී මේ පිළිබඳ සැලකිලි මත් වන බව අපට දන්වන ලදි.

#### (ඇ) කෙරී ගෙන යන වැඩ

කෙරී ගෙන යන වැඩ ගිණුම් සම්බන්ධ ගෙවීම්, වැඩය අවසාන කිරීමටත් කලින් ප්‍රාග්ධනිත කරනු ලැබේ. 1966 මාර්තු 26 දතම අප වාර්තාවෙන් මේ පිළිබඳව සවිස්තරව නිර්දේශ කරන ලදි. අප වාර්තාව ලැබීමෙන් පසු අප නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ ලේඛනයක් මෙහෙය වන ලද බව පෙනින.

#### (ඈ) ස්ථාවර වත්කම් විකිණීම

වසර තුළ පහත දක්වෙන ස්ථාවර වත්කම් විකිණිනි.

තේ අඹරන යන්ත්‍රය—රුපි: 1,205/- ක් ලැබිණ.

ඉහත වත්කම විකිණීමෙන් ලද පාඩුව හෝ ලාභය දක්වීමට කිසි ම වෙනස් කිරීමක් නො කොට තිබුණි. මේ වෙනස මෙම වසරේ දී කළ යුතු යැයි අදහස් කරමු.

සීමාසහිත එංජිනියරින් සර්විසස්වලින් ලබා ගත් තවමරණ දෙණිකාවක් නැවත සැපයුම්කරුවනට යවන ලදි. ක්ෂය සඳහා සියයට පහක් අඩු කිරීමෙන් පසු සැපයුම් කරුවෝ මුදල ගෙවූහ. රුපි: 2,301.09 ක ක්ෂය ප්‍රමාණය සම්මුචිත අරමුදලට පැවරිය යුතුව තිබුන ද වරදකින් එය ස්ථාවර වත්කම් ගිණුමට ඇතුළත් කොට තිබුණි.

#### (ඉ) ගෘහනිර්මාණ ශිල්පීන්ගේ ගාස්තු

පහත රට ස්ථානයේ ඉදි කෙරුනු ගොඩනැගිලි සඳහා ඔවුන්ට ගෙවිය යුතුව තිබුණු මුලු මුදල වන රුපි: 60,397.45 න්, රුපි: 50,000 ක් අත්තිකාරම් මුදල් වශයෙන් 1965 අප්‍රියෙල් 19 වෙනි ද බිලිමෝරියා ද සිල්වා සහ සමාගමට ගෙවන ලදි. ශේෂය වූ රුපියල් 10,397.45 ගිණුම්වල වෙන් කොට නොතිබිණි.

### (5) ලංකා හා එ. රා. රජයේ සුරැකුම් පත්—රුපි: 579,475.32

ලංකා රජයේ සුරැකුම් පත් ලේඛන අප පරීක්ෂා කළ අතර ඒවා ලේඛනයන් හි සඳහන් හැටියට රු: 517,112.50 ක් විය. එ. රා. රජයේ සුරැකුම් පත් තැන්පත්කරුවන් වූ නැෂනල් ග්‍රින්ලේස් සහ සමාගම එම ලේඛනයක් අනුව, එය රුපි: 62,362.82 ක් බව සනාථ කළේ ය. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ආයෝජනයන්ගේ වෙළෙඳ වටිනාකම රුපි: 543,455.20 ක් විය.

### (6) තොග—රුපි: 428,101.19

ආයතනය සතු බඩු තොගයන් පිළිබඳ සාරාංශය මීට යා කොට ඇති උපලේඛනයෙහි දක්වේ. අවුරුද්ද අවසානයේ දී පොදු හා විදුලි භාණ්ඩ තොග සියල්ලම ගැන හරි වැරදි බලන ලදි. සොයා ගත්තා ලද වෙනස එතරම් විශාල නොවූවත් ඒ අනුව කාර්යාලයේ

කාඩ් පත් වෙනස් නොකරන ලදි. ගිණුම් සූදනම් කිරීමේ දී කාර්යාලයේ තොග සටහන් පත්‍ර සංඛ්‍යා උපයෝගී කර ගන්නා ලදි. වෙනසට හේතුව මුලින් සොයා බැලිය යුතු බවත් මණ්ඩල අනුමතිය ලබා ගැනීමෙන් පසු කාර්යාල සටහන් පත්‍රවල වෙනස දැක්විය යුතු බවත් අපි අදහස් කරමු. ගණන් පරීක්ෂණයන් ගෙන යෑම පහසුවනු පිණිස අඩු තරමින් ගබඩාවේ තොග සටහන් පත්‍ර අවුරුදු දෙකක්වත් විනාශ නොකොට තබා ගත යුතු යැයි අපි අදහස් කරමු.

ඉහත දක්වා ඇති තොගයනට ලිපි ද්‍රව්‍යවල වටිනාකම් නො දැක්වේ. මේවා මිළ දී ගනු ලබන විට ආදායමට ලියා හරින බැවිනි. හේතු දෙකක් නිසා අභාවිත ලිපි ද්‍රව්‍ය තොග කොටසට ලිවීම යෙහෙකැ යි අපි අදහස් කරමු.

(1) ශේෂ පත්‍රය සැබෑ තත්වයක් විදහා පෑම සඳහා

(2) ලිපි ද්‍රව්‍ය තොග සම්බන්ධයෙන් වැඩියෙන් පාලනයක් තබා ගත හැකි වනු සඳහා

1965 දී මොටෝ රථ අමතර කොටස් ලබා ගැනීම හා නිකුත් කිරීම සම්බන්ධයෙන් ලේඛන තබා නොතිබුණි. 1966 ජූනියේ සිට මෙය තබා ඇති බව නම් පෙනුණි. එදිනෙද භාවිතය සඳහා අවශ්‍ය විදුලි භාණ්ඩ තබා ගන්නා විදුලි පෝර්මන් තැනට ඒ සඳහා අවශ්‍ය ලේඛන තබා ගන්නා ලෙස අප විසින් ඉල්ලා සිටින ලදි. මෙම ලේඛනයන්හි තොග ලද දිනයත්, ප්‍රමාණයත් හා ඒවා යෙදීම පිළිබඳ විස්තර දැක්විය යුතු වේ.

**(7) කෙරී ගෙන යන වැඩ**

කාර්මික දෙපාර්තමේන්තුව මගින් කර ගෙන යනු ලබන වැඩ පෙන්නුම් කිරීමට අවශ්‍ය ලේඛන පවත්වා ගෙන යනු ලැබේ. ලබා ගත් භාණ්ඩ පිළිබඳ වැඩ පත්‍රවල දැක්වෙන තොරතුරු වැඩ පොල කාර්ය අංකයන් හා සැසඳීමක් නොවී ය. වැඩ පත්‍රයට වැඩපොල නියාමය ඇමිණීමක් නොවී ය. මෙම වසර සම්බන්ධ වැඩ පත්‍ර කිහිපයක් ද අප විසින් පිරික්සන ලද නමුත් මෙය නොකරන ලද බව පෙනිත.

**(8) ණයකරුවන් හා ණය ශේෂය**

ණය කරුවන් හා ණය ශේෂය පිළිබඳ උපලේඛනය මෙම වාර්තාවට අමුණා ඇත. අප අදහස් මෙසේ ය.

**(අ) අනෙක් ණය කරුවෝ—රුපි: 13,982.32**

මෙම ශීර්ෂය යටතේ දක්වා ඇති දේ අතර අය කර ගත හැකි යැයි අනුමාන කෙරෙන පහත සඳහන් දෑ ඇතුළත් ය.

| | | |
|---|---|---|
| | | මුදල |
| කොළඹ කොමර්සල් සමාගම ... ... | රු: | 520.05 |
| ඩී. එල්. ගන් ... ... ... ... | | 155.02 |
| සුළු නිලධාරී සංගමය ... ... ... | | 4.05 |
| තේ පාලන දෙපාර්තමේන්තුව ... ... | | 42.60 |
| දිඹුල කතෝලික සංගමය ... ... ... | | 25.50 |
| පී. එච්. ඒ. ද සිල්වා ... ... ... | | 1.25 |
| අග්‍රා ක්‍රීඩා සමාජය ... ... ... | | 33.60 |
| ඩී. ඒ. සී. සී. ... ... ... ... | | 4.30 |
| මට්ටකැලේ වතුයාය ... ... ... | | 232.54 |
| සී. කුමාරසූරියර් ... ... ... | | 34.50 |
| නැසීගිය—වෙල්ලායන් ... ... ... | | 5.40 |
| එම්. සුප්පයියා ... ... ... ... | | 10.00 |
| කෘෂිකර්ම අධ්‍යක්ෂක ... ... ... | | 174.96 |
| සීමාසහිත වෝකර් සහ ග්‍රෙග් ... ... | | 90.00 |
| ජේ. වොල්ටර් තොම්සන් ... ... ... | | 310.00 |
| ග්‍රාන්ට්ස් ඇඩ්වටයිසින් ... ... ... | | 1,560.00 |
| ඩී. එච්. පී. එස්. සිරිවර්ධන ... ... ... | | 98.50 |
| කන්දසාමි පිල්ලේ ... ... ... | | 66.50 |
| එච්. එන්. හසලෝ ... ... ... | | 7.90 |
| | | **3,376.67** |

**(ආ) නිලධාරි ණය—රුපි: 77,274.01**

දැනට ආයතනයේ සේවයෙහි නොමැති නිලධාරීන්ගෙන් රුපි: 1,248.85 ක් අය විය යුතු ය. මෙයින් රුපි: 33.85 ක් අය කර ගත නොහැකි අතර අනෙක් මුදල් අර්ථසාධක අරමුදල් භාරකරුවන් ගෙන් අය කර ගැනීමට කටයුතු යොදනු ලැබේ.

**(ඇ) භූමිතෙල් උඳුන් සඳහා මුදල්—රුපි: 2,146.65**

ආයතනයේ සිටි නිලධාරීන් ගෙන් රුපි: 201.52 ක් අය කළ යුතු වේ. මෙයින් රුපි: 25.02 ක් අයකර ගත නොහැකි අතර ඉතිරි මුදල අර්ථ සාධක අරමුදලේ භාරකරුවන් ගෙන් අය කර ගැනීමට බලාපොරොත්තු වේ.

**(ඇ) නිලධාරි අයකර ගැනීම් ගිණුම—රුපි: 6,731.93**

මෙම ගිණුම තුලනය කිරීමෙන් අපට පෙනී ගියේ රුපි: 7,353.20 ක් අය කර ගත යුතුව ඇති බව ය. රුපි: 621.27 ක වෙනස තවමත් සැසඳිය නො හැකි විය. නිලධාරියකුගෙන් අය විය යුතු රුපි: 1.45 හැරෙන්නට අනෙක් මුදල් දැන් අය කර ගෙන ඇත.

හැම අවුරුද්දකම මෙම ගිණුමෙහි මේ වෙනස පිළිබඳව අප විසින් කරුණු දක්වා ඇති මුත් හැම මාසයක් අවසානයේ ම මේ ගිණුම සැසඳිය යුතුය යන අප අදහස ක්‍රියාත්මක කොට නොමැති බව අපි සඳහන් කරමු.

අප විසින් යෝජිත කොට ඇති පරිදි පොතක් තබා ගැනීමෙන් මෙම ගිණුම මාසිකව සැසැඳීම අවශ්‍යයෙන් ම කළ යුතු බව අප විසින් මණ්ඩලයට අදහස් කොට ඇත.

**(9) තැන්පත් මුදල්—රුපි: 17,667.18**

මෙම මුදලට ඇතුලත් කොට ඇති කරුණු අතර කලුතර තැපැල් පතිට ගෙවන ලද රුපියල් 30 ක් ද ඇතුලත් වේ .මෙය 1964 ජනවාරි 4 වෙනිද නිරාකණරය කරන ලදැයි තැපැල්පතිවරයා පවසයි. මෙම කරුණ පිළිබඳ විමසිය යුතු ය.

පහත දැක්වෙන තැන්පත් මුදල් සම්බන්ධයෙන් සහතික නොලැබිණ.

| | | |
|---|---|---|
| සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් ... ... ... | රුපි: | 150 |
| රජයේ විදුලි වැඩ දෙපාර්තමේන්තුව, නුවරඑළිය ... | | 3,741 |
| | | 3,891 |

**(10) බැංකුවෙහි හා අතැති මුදල්**

සහකාර ලේකම්වරයා අතැති මුදල් අප විසින් ගිණිනු ලැබී ය. 1966 නොවැම්බර් 8 වෙනි ද පොත්වල පෙනෙන ශේෂය හා අතැති මුදල් ගැලපිණි.

ආයතනයට ගෙවනු ලබන මුදල් සුළු මුදල් පොතෙහි ගෙවීම් වශයෙන් ඇතුලත් කරන බව අපට දැක හැකි විය. මෙවැනි ගෙවීම් බැංකුවෙහි වෙනම තැන්පත් කිරීම අපහසු බව අපට පෙන්වා දුනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සුළු මුදල් ආග්‍රීමය ක්‍රමයකට ගෙන යෑම අපහසු වේ. කෙසේ වුව ද මේ මුදල් ඉතාම අඩු ප්‍රමාණයකට ගෙන යා යුතු බව අප විසින් අවධාරනය කරන ලදි. ආයතනය වෙනුවෙන් විවිධ මිළ දී ගැනීම් සඳහා නිලධාරීන්ට ගෙවන ලද මුදල් පිළිබඳ විස්තරයක් මෙයට ඇතුළත් වේ. මෙම පුරුද්ද හැකිතාක් මඟ හරවන ලෙස අපි අදහස් කරමු.

**(ආ) බැංකුවෙහි ඇති මුදල්**

1966 මැයි මස සුදනම් කළ බැංකු තුලන පත්‍ර අනුව රුපි: 100 ක හා රුපි: 75.50 ක චෙක්පත් දෙකක් කැපී පෙනේ. මේවා කලින් උප ලබ්ධි වූ බව බැංකුව කියා සිටියි. බැංකු ප්‍රකාශනවල දක්වා ඇති බැර කිරීම් හඳුනා ගැනීම සම්බන්ධයෙන් ආයතනයේ නිලධාරීන් යම යම දුෂ්කරතාවයනට මුහුණ පායි. එක එක තැන්පත් කිරීම සම්බන්ධයෙන් අනුක්‍රමික අංක යෙදීමත් මේවා තැන්පත් කිරීම් පත්‍රවලට ගැලපීමේ ක්‍රමයකුත් දැන් අනුගමනය කර ගෙන යනු ලැබේ. මෙය සතුටුදයක අන්දමින් ක්‍රියාත්මක වන බව පෙනේ.

## IV. වතුයා කාරක ගිණුම

### (1) සාන්ත කුම්බස් වතුයාය

මෙම වසර තුළ නිෂ්පාදනය කරන ලද තේ ප්‍රමාණය රාත්තල් 419,338 ක් විය. එයින් රුපි: 1,052,566.86 ක් ලැබිණ. පසුගිය වසරේ දී නිෂ්පාදිත ප්‍රමාණය රාත්තල් 306,717 ක් වූ අතර එයින් රුපි: 897,334 ක් ලැබිණ. 1965 දෙසැම්බර් 31 වෙනි දයින් අවසන් වූ වර්ෂයේ සාමාන්‍ය වෙළෙඳ මිළ රාත්තලකට රු. 2.51 ක් විය. පසුගිය වසරේ එය රු: 2.92 ක් විය. බ්‍රෝකර් ගාස්තු, ප්‍රවාහනය, වට්නාකම් බද්ද ඇතුලුව නිෂ්පාදන වියදම රාත්තලකට රු: 1.96 ක් විය. වතුයාය ගෙන යැමේ ප්‍රතිඵලයක් වූයේ රුපි: 287,862.03 ක ලාබයක් ලැබීම ය. පසුගිය වසරේ එය රුපි: 252,074 ක් විය. ආයතනය මගින් දරණ ලද වතුයා වියදම රුපි: 63,763 ක් විය.

### (2) සාන්ත ජෝයකිම් වතුයාය

1965 දෙසැම්බර් 31 වෙනි දයින් අවසන් වූ වසර තුළ තේ රාත්තල් 329,611 ක් නිපදවූ අතර එයින් රුපි: 572,989 ක් ලැබිණ. සාමාන්‍ය වෙළෙඳ මිළ රු: 1.74 ක් විය. බ්‍රෝකර් ගාස්තු, ප්‍රවාහන ගාස්තු හා වට්නාකම් බද්ද ඇතුලුව නිෂ්පාදන වියදම රු: 1.51 ක් විය. වතුයාය ගෙන යැමේ ප්‍රතිඵලයක් වූයේ රුපි: 77,381.47 ක ලාභයක් ඇතිවීම ය.

## V. අය වැය ගිණුම

### (1) තේ සෙස් බද්ද

ප්‍රධාන රේගු අයකැමිගේ උපදෙස් අනුව, අපනයන කරන ලද තේ ප්‍රමාණය රාත්තල් 493,927,346 ක් විය. ආයතනය ලද සෙස් බද්ද රුපි: 4,918,606.80 ක් විය. පිටරට යවන ලද තේ සම්බන්ධයෙන් රේගු අයකැමි දක්වූ සංඛ්‍යාවන් හා අනෙකුත් මුද්‍රිත සංඛ්‍යා අපට සැසඳිය නොහැකි විය.

### (2) විවිධ මුදල් ලැබීම

මීට ඇතුලත් කොට ඇති මුදල් අතර කිට විද්‍යා දෙපාර්තමේන්තුව ලද ආධාර මුදලක් වූ රුපි: 92,505 ක් ද ඇතුලත් වේ. මෙම ආධාර මුදල් ලැබීම 1966 මාර්තු මසින් අවසන් විය.

### (3) වියදම

පසුගිය වසර හා සසඳන විට පහත සඳහන් විෂයන් සම්බන්ධ වියදම් විශාල වශයෙන් වැඩි විය.

| | 1965<br>රුපි: | 1964<br>රුපි: | කරුණු |
|---|---|---|---|
| ජීව රසායන අංශය (නිෂ්පාදනය) | 31,373 | 1,095 | — — — |
| පුස්තකාලය ... ... | 52,102 | 26,341 | පසුගිය වසරේ නියෝග කළ පොත් මෙම වසරේ ලැබීමෙන් |
| ගෙවතු හා භූමි නඩත්තු කිරීම | 34,060 | 17,121 | ආහාර නිෂ්පාදනයට වතු හෙළි කිරීම.<br>තේ වගාවට නව වතු ගෙන ඒම.<br>1965 සිට සියලු ම නිවාස ආයතනය මගින් ම මෙහෙයවීම. |
| වාහන සඳහා තෙල් ... | 58,489 | 41,080 | — — — |
| ටයර් ... ... | 39,463 | 19,753 | අලුත් ටයර් ගැනීම, කලින් ටයර් නැවත ප්‍රකෘති කරන ලදි. |

| | 1965 | 1964 | කරුණු |
|---|---|---|---|
| | රුපි: | රුපි: | |
| අමතර කොටස්... ... | 37,668 | 14,722 | ආයතනයේ වාහන පැරණි ය. විශාල අලුත් වැඩියා කිරීම් අවශ්‍ය ය. අමතර කොටස් ලබාගත නොහැකි වීමෙන් අලුත් වැඩියා කිරීම ඒජංත-වරුන් විසින් කරන ලදී. |

සැ: යු: ටයර් හා අමතර කොටස් සඳහා වියදම වැඩිවීම සම්බන්ධයෙන් දෙන ලද හේතුවල නිවැරදිතාවය අපට සෙවිය නොහැකි විය. අලුත්වැඩියා කිරීම හා එක එක වාහනයට දමන ලද අමතර කොටස් පිළිබඳ වාර්තා නොමැතියි.

| | | | |
|---|---|---|---|
| රක්ෂණය ... ... | 55,794 | 24,759 | වතුයාවලින් ලබා ගත යුතු එහෙත් වැරදීමකින් ආයතනයෙන් ලබා ගත් රුපි: 17,000. අනතුරු හා අසනීප ඔප්පු රුපි: 12,000. |

**(4) ඇස්තමේන්තු**

ඇස්තමේන්තු ඉක්ම වූ සියලු ම වැය සඳහා (එකක් හැර) මණ්ඩලයේ ආවරණ අනුමතිය ලැබිණ.

| | වියදම | ඇස්තමේන්තු | අතිරේක |
|---|---|---|---|
| 7 විෂය: වැය 94 ... | රු. 42,550 | රු. 37,970 | රු. 4,580 |

**(5) අමු තේ කොළ විකිණීම**

පස්සර අමු තේ කොළ රාත්තල ශත 20 බැගින් විකුණුනු ලැබේ. මෙම මිළ අවුරුදු කිහිපයකට පෙර හිටපු අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද්දක් වූ අතර එය තරමක් පහළ බව පෙනේ. මිළ සංශෝධනය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු සමඟ සාකච්ඡා කරන බව දැන ගන්නට ලැබේ.

**(6) ආදායමට ගොනු කළ ප්‍රාග්ධන වියදම්**

අප විසින් කරන ලද කරුණු සෙවීම්වල දී ප්‍රාග්ධනමය වන පහත දැක්වෙන වියදම් ආදායමට ගොනු කොට ඇති බව පෙනිණ.

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය 7 | වැය | 93 | ඇමිනෝමීටර් ... ... | රුපි: 7,065.99 |
| | | 95 | ක්‍රෝනෝටැන්කිය හා ද්‍රව ද්‍රෝණිකාව | 2,404.38 |
| | | 98 | රාක්ක ... ... ... | 3,138.74 |
| | | 99 | ඉසින යන්ත්‍ර 2 ... ... | 671.53 |
| | | 99 සී | මයික්‍රොනයිසර් ... ... | 807.50 |
| | | 100 | ස්පිරිට් ලාම්පුව හා බන්සන් ලිප ... | 553.69 |
| ශීර්ෂය 10 | | 125 | පොට් කොතයර් ... ... | 3,462.90 |
| | | 126 | ඉමර්සන් හීටර්ස් ... ... | 250.85 |
| | | 127 | බිත්ති අල්මාරි ... ... | 3,523.57 |
| 11 | | 136 ඒ | ටෙලිපෝනය හා වයර් . ... | 4,735.00 |
| | | | | 26,614.15 |

**(7) දෙවු ශ්‍රේණි වැටුප්**

දෙවු ශ්‍රේණි නිලධාරීන් සඳහා ගෙවන ලද සියලු ම වේතනාධික ඔවුන්ගේ පත්වීම් කොන්දේසි අනුව බවත් මණ්ඩලය අනුමත කරන ලද බවටත් අපි සෑහීමට පත්වීමු.

ඉහත සඳහන් ගිණුමට ඇතුළත් කොට ඇති ගෙවීම් අතර පහත දැක්වෙන දෑ ඇතුළත් විය.

| | | |
|---|---|---|
| අර්ථ සාධක අරමුදල වෘධි කිරීම | රු:52,555 | මණ්ඩලය අනුමත කළා ය. |
| ජීව රසායන විද්‍යාංශ තැනගේ අර්ථ සාධක අරමුදල් හිඟ | 7,144.18 | 62,7.28 සිට 64.6.17 දක්වා වූ විදේශයේ සිටි කාලයට සේවකයාගේ හා සේවායා ගේ දායක ගාස්තු ආයතනය ගෙවන බව පත්වීම් ලිපියෙහි දක් වේ. |
| නිවාඩු වැටුප්— හිටපු ශෂ්‍ය විද්‍යාංශ | 14,148.87 | ගිවිසුමට අනුව මාස තුනක නිවාඩුවකට අයිති ය. ඉතිරි 16 දිනය අධ්‍යක්ෂවරයා අනුමත කළේ ය. |
| නිවාඩු වැටුප්— හිටපු ප්‍රධාන පරිපාලක නිලධාරි | 3,350.00 | මණ්ඩලය අනුමත කළා ය. දෙමසක නිවාඩු අයිතියි |
| නිවාඩු වැටුප්—හිටපු අධ්‍යක්ෂක | 26,760.42 | පහත සටහන බලන්න. |

නොගෙන තිබූ නිවාඩු සඳහා හිටපු අධ්‍යක්ෂවරයාට (ආචාර්ය ජොයකිම්) රුපි: 26,760.42 ක් ගෙවන ලදි. අවුරුදු 9 යක් තුළ එකතු වූ මෙය දින 233½ ක් විය. මේ සම්බන්ධයෙන් මීට අදළ කරුණු උපුටා දක්වමු.

(අ) ආචාර්ය ඒ. ඩබ්ලිව්. ආර්. ජොයකිම්ට යැවූ 1960 දෙසැම්බර් 8 දතම අධ්‍යක්ෂ වරයාගේ ලිපිය—

"1962 අවසානය තෙක් ඔබේ නිවාඩු නොමැති වී යන්නේ නැති බවත් එවා එකතු කළ හැකි බවත් මම තීරණය කරමි. එනම් එවිට නිවාඩු එකතු කිරීම පිළිබඳ තවත් තීරණයක් නොගන්නේ නම් එම දිනට ඔබ අර ගෙන නොමැති නිවාඩු 1963 මුල දී ගත යුතු ය."

(ආ) 1965 ජුනි 7 මණ්ඩල රැස්වීම් වාර්තා—

"179½ ක් වූ ආචාර්ය ජොයකිම්ගේ එකතු වූ නිවාඩු ඉදිරියට ගෙන යෑමට මණ්ඩලය අනුමත කළා ය. මෙම නිවාඩු ප්‍රමාණය මුළුමනින් ම නුදුරු අනාගතයේ දී ම ඔහුට ගැනීමට නොහැකි බව ද සඳහන් කර ගන්නා ලදි. මාස 2 හෝ 3 ක නිවාඩුවක් කලින් ගෙන අනෙක් නිවාඩු විශ්‍රාම ගැනීමේ දී ගන්නා බව ද සඳහන් කර ගැනිණ."

**(8) අන්තරමධ්‍ය හා කණිෂ්ඨ නිලධාරි වැටුප්**

මේ ශීර්ෂය යටතේ වියදම් වැඩි වූයේ අර්ථ සාධක අරමුදල් වෘධි කිරීම සඳහා වූ ගෙවීම් හේතුකොට ගෙන ය. මේ සම්බන්ධයෙන් අන්තර් මධ්‍ය හා කණිෂ්ඨ නිලධාරීන්ට ගෙවූ ප්‍රමාණයන් පිළිවෙලින් රුපි: 47,683 ක් හා රුපි: 97,685 ක් විය.

## VI. ආභ්‍යන්තර ගණන් පරීක්ෂණය

1966 දී ප්‍රධාන පරිපාලක නිලධාරිගේ විධානය යටතේ කණිෂ්ඨ ගණක ලිපිකරුවෙක් අභ්‍යන්තර ගණන් පරීක්ෂක වශයෙන් කටයුතු කොට ඇත. 1966 මැයි මස සිට සැප්තැම්බර් දක්වා හන්තාන, කොට්ටාව, පහත රට ආදී ස්ථානවලට ගිය ගමන් ඇතුළත් කොට වාර්තා 8 ක් ඉදිරිපත් කරන ලදි. මේ අභ්‍යන්තර ගණන් පරීක්ෂණය බෙහෙවින් පුළුල් කළ යුතු යැයි අපි නිර්දේශ කරමු. මෙම කටයුතු භාරව දෙවු නිලධාරියකු පත් කළ යුතු යැයි ද අදහස් කරමු. අනෙක් කටයුතුවලට අතිරේකව තොග පත්‍රවල සඳහන් බඩු ලේඛන යටතේ ඇති සංඛ්‍යා ආදිය ද අභ්‍යන්තර ගණන් පරීක්ෂක කණ්ඩායම විසින් පිරික්සිය යුතු යැයි ද අපි අදහස් කරමු. දැනට බඩු තොග පිළිවෙළකට සකස් කොට නොමැති හෙයින් මෙය කළ නොහැකි ය. 1966 වන විට නව ගබඩාවක් සූදානම් වන බව අපට පවසන ලදි.

## VII. අභ්‍යන්තර පාලනය

අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් ආයතනයේ පවතින ක්‍රමය පහත සඳහන් කරුණුවලට යටත්ව සතුටුදායක බව පෙනේ.

**(අ) භාණ්ඩ ඉල්ලුම් කිරීම හා සපයා ගැනීම**

තොග වශයෙන් බඩු මිළ දී ගැනීම සඳහා මෙම වසර තුළ දී මිළ ගණන් විමසීමක් නොකෙරිණ. 1966 දී මෙය කෙරිණ. 1966 සිට භාණ්ඩ ලැබීම දක්වෙන ලේඛන ඉදිරිපත් කරන ලදි. මෙය සම්බන්ධයෙන් 1965 පාලනය සඳෙයි.

**(ආ) ගෙවීම සඳහා ඉන්වොයිසියන් අනුමත කිරීම**

ගෙවීම් වවුචරයට බොහෝ විට ඉන්ඩෙන්ටු පිටපත් නොඇමිණිනි. 1966 සිට භාණ්ඩ ලැබීම් ලේඛන ඉදිරිපත් කිරීමත් සමඟ ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය තව ශක්තිමත් වේ යැයි අදහස් කෙරේ.

ආනයනයන් සම්බන්ධයෙන් නම් ගෙවීම් කරනු ලබන්නේ කලින් වුව ද භාණ්ඩ ලද බවට විමසීමක් නොකෙරිණ. අප විසින් අනුමත කොට viii (ආ) හි දක්වා ඇති අදහස් ක්‍රියාවට නඟතොත් ආනයනයන් සම්බන්ධයෙන් ද පාලනය ශක්තිමත් වේ යැයි හඟිමු.

## VIII. ගණක ක්‍රමය

පහත දක්වෙන කරුණුවලට යටත්ව භාවිතා වන ගණක ක්‍රමය සතුටුදායක ය.

**(අ) කෙරී ගෙන යන වැඩ**

මේ සම්බන්ධ අප නිර්දේශ 1966 දී ක්‍රියාවට නඟා ඇති හෙයින් ඒ පිළිබඳ නවත් කරුණු කියා පෑම අනවශ්‍ය ය.

**(ආ) මාර්ගස්ථ බඩු**

ආනයන භාණ්ඩ සඳහා ගෙවීම බඩු ලැබීමට කලින් කරනු ලබන අතර ගෙවනු ලබන විට මේවා වියදමට හර කරනු ලැබේ. මෙසේ ගෙවනු ලබන ප්‍රමාණයන් මුලින් මාර්ගස්ථ බඩු ගිණුමකට හර කළ යුතු යැයි අපි අදහස් කරමු. අනතුරුව බඩු ලැබීමෙන් පසු එය ආදායමට, තොගයනට හෝ ප්‍රාග්ධන යන අදාල ගිණුමට පැවරිය හැකි ය. මෙම පැවරීම ගබඩා කරුගෙන් තොරතුරු ලැබීමෙන් පසු හැම මාසයක් අවසානයේ ම කළ යුතු ය. ඕනෑම වේලාවක මෙම ගිණුමෙහි ඇති ශේෂය කලින් ගෙවන ලද,නමුත් තවමත් නොලැබී ඇති භාණ්ඩ නිරූපනය කළ යුතු වේ.

**(ඇ) කාර්ය සංවිධාන සංග්‍රහය**

ගණක පිළිවෙත් අඩංගු සංග්‍රහයක කෙටුම් පතක් සූදනම් බව සතුටින් සඳහන් කරමු. ඔබට අවශ්‍ය නවත් කරුණු ඇතොත් ඒවා යැපයීමට ද සතුටු වෙමු.

විශ්වාසි,

**පෝර්ඩ්, රොඩ්ස්, තෝන්ටන් සහ සමාගම**

උපලේඛනය 1

# ලංකා තේ පර්යේෂණායතනය

## 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය

| 1964 රුපි: | | | රුපි: ශත | රුපි: ශත |
|---|---|---|---|---|
| | **සමුච්චිත අරමුදල** | | | |
| | 1964 දෙසැ: 31 වෙනි දිනට ශේෂය ... ... | | 13,113,812.73 | |
| | පසුගිය වසර සම්බන්ධ වෙනස් කිරීම් ... | 4,360.54 | | |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් පාඩුව ... | 6,022.92 | 10,383.46 | |
| | | | 13,103,429.27 | |
| | ආයෝජනයන් විය මිළට දක්වීම ... ... | | 39,383.90 | |
| 13,113,813 | වසරේ වැයට අධික ආදයම ... ... ... | | 837,439.03 | 13,980,252.20 |
| 764,443 | ණය හිමියෝ හා සැපයීම ... .. ... ... | | | 600,212.74 |
| 2,000,000 | රජයේ ණය ... ... ... ... ... | | | 1,833,330.00 |
| 15,878,256 | | | | 16,413,797.94 |

| 1964 රු: | | රුපි: ශත | රුපි: ශත | රුපි: ශත |
|---|---|---|---|---|
| | **ස්ථාවර වත්කම්** | | | |
| | 1964 දෙසැ: 31 ට මිළ ... ... ... | | 15,800,697,84 | |
| 15,800,698 | වසරේ එකතු වීම් (අඩු කිරීම් හැර) ... ... | | 1,559,657.18 | 17,360,355.02 |
| | 1964 දෙසැ: 31 ට ක්ෂය ... ... ... | | 3,736,233.58 | |
| 3,736,234 | වසර තුළ ලියා හළ ක්ෂය ... ... ... | | 864,044.37 | 4,600,277.95 |
| 12,064,464 | | | | |
| 540,092 | ලංකා රජයේ හා එ. රා. රජයේ සුරැකුම් පත්—මිළට ... ... (දළ වෙළඳ මිළ—රු: 543,455.20) | | | 579,475.32 |
| | **ජංගම වත්කම්** | | | |
| | මිළට විකුණු තේ ... ... | 185,302.97 | | |
| | පොදු හා විදුලි භාණ්ඩ ... ... | 197,786.37 | | |
| | වතුයා භාණ්ඩ තොග ... ... | 38,721.05 | | |
| | රත්නපුර පහත රට ස්ථානයේ භාණ්ඩ ... | 6,290.80 | 428,101.19 | |
| | හර හා අනෙක් හර ශේෂය... ... ... | | 844,405.19 | |
| | ණය කරුවෝ—නිලධාරි ... ... ... | | 93,164.33 | |
| | තැන්පත් ... ... ... ... | | 17,667.18 | |
| 3,273,700 | අතෙහි හා බැංකුවේ ඇති මුදල් ... ... | | 1,690,907.10 | 3,074,245.55 |
| 15,878,256 | | | | 16,413,797.94 |

ලංකා තේ පර්යේෂණායතනයේ පොත් සමඟ ඉහත දක්වෙන ශේෂ පත්‍රය පිරික්සූ වෙමු. අපට අවශ්‍ය සියලුම පැහැදිලි කිරීම් හා තොරතුරු ලදිමු. 1966 දෙසැම්බර් 31 දතම මෙයට අමුණා ඇති අප වාර්තාවේ දක්වෙන කරුණු වලට යටත්ව, අපට දක්වූ කරුණු හා පැහැදිලි කිරීම් අනුවත් පොත් පත් අනුවත්, 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ආයතනයේ මුදල් තත්වය පිළිබඳව සැබෑ තත්වයක් විදහා දක්වෙන අයුරින් ඉහත සඳහන් ශේෂ පත්‍රය සුදනම් කොට ඇත.

1967 මාර්තු, කොළඹ,

අත්සන් කළේ: ෆ්‍රෝඩ්, රොඩ්ස්, තොන්ටන් සහ සමාගම
චාර්ටර්ඩ් ගණකාධිකවරු,

අත්සන් කළේ: එෆ්. අමරසූරිය (සභාපති)
අත්සන් කළේ: ජේ. එල්. ඩී. පීරිස්
ලංකා තේ පර්යේෂණායතන පාලක මණ්ඩලය වෙනුවෙන්

# ලංකා තේ පර්යේෂණායතනය



## 1965 දෙසැම්බර් 31 වෙනි දිනට අවසන් වන වසර සඳහා සාන්ත කුම්බ්ස් වතුයා කාරක ගිණුම

| 1964 රුපි: | රු: | | රුපි: ශත | රුපි: ශත |
|---|---|---|---|---|
| | | **වතුයා වියදම්** | | |
| | 129,311 | පොදු ගෙවීම් ... ... ... | 123,792.47 | |
| | 101,899 | ක්ෂේත්‍ර වැඩ හා වගා කිරීම් ... ... | 109,412.64 | |
| 488,030 | 256,820 | නිෂ්පාදනය ... ... ... | 391,234.90 | 624,440.01 |
| 14,442 | | කොළඹ බ්‍රෝකර්වරුන්ගේ ගාස්තු හා අනෙක් වියදම්. ... | | 18,573.53 |
| 161,062 | | වට්නාකම් වෙළෙඳ බද්ද ... ... ... | | 129,305,66 |
| 163 | | වෙළෙඳ බද්ද වෙනුවෙන් හර බද්ද ... ... | | 87.99 |
| 252,074 | | අයවැය ගිණුමෙහි ශේෂය ... ... ... | | 287,862.03 |
| 915,771 | | | | 1,060,269.22 |

| 1964 රුපි: | | රාත්තල් | රුපි: ශත |
|---|---|---|---|
| | **තේ විකිණීම මුළු ආදයම** | | |
| | කොළඹ ... ... ... | 395,538 | 1,033,120.28 |
| | අභ්‍යන්තර බී. ඕ. පී. ... ... ... | 3,740 | 6,591.42 |
| | අභ්‍යන්තර බී. එම්. ... ... ... | 14,219 | 11,867.24 |
| | කර්මාන්ත ශිල්පාංශය ... ... ... | 424 | 987.92 |
| | නොමිලේ ... ... ... | 5,417 | — |
| 897,334 | | 419,338 | 1,052,566.86 |
| 18,437 | ක්ලෝන අතුකැබෙලි විකිණීම . ... ... ... | | 7,702.36 |
| 915,771 | | | 1,060,269.22 |

## 1965 දෙසැම්බර් 31 වෙනිදට අවසන් වන වසර සඳහා සාන්ත ජොයකිම් වතුයා කාරක ගිණුම



| 1964 | | | රුපි: ශත | රුපි: ශත |
|---|---|---|---|---|
| | | **වතුයා වියදම්** | | |
| | 129,548 | පොදු ගෙවීම් ... ... ... | 123,896.04 | |
| | 128,993 | ක්ෂේත්‍ර වැඩ හා වගා ... ... | 125,355.74 | |
| | 123,572 | නිෂ්පාදනය ... ... ... | 220,923.01 | |
| 382,113 | — | අනෙක් ගෙවීම් ... ... ... | 3,537.51 | 473,712.30 |
| | | **ගාස්තු** | | |
| | | කොළඹ බ්‍රෝකර්වරුන්ගේ ගාස්තු හා අනෙක් ගෙවීම්... ... | | 12,563.96 |
| | | වට්නාකම් වෙළෙඳ බද්ද ... ... ... | | 11,739.21 |
| | | වෙළෙඳ බද්ද අනුව හර බද්ද ... ... ... | | 7.50 |
| 47,955 | | අය වැය ගිණුමෙහි ශේෂය ... ... ... | | 77,381.47 |
| 334,158 | | | | 575,404.44 |

| 1964 රුපි: | | රාත්තල් | රුපි: ශත |
|---|---|---|---|
| | **තේ වෙළඳාම මුළු ආදයම** | | |
| | කොළඹ ... ... ... | 325,028 | 571,093.78 |
| | අභ්‍යන්තර බී. ඕ. පී. ... ... ... | 36 | 64.45 |
| | අභ්‍යන්තර බී. එම්. ... ... ... | 461 | 184.40 |
| | අභ්‍යන්තර කුඩු ... ... ... | 4,082 | 1,646.16 |
| | නොමිලේ ... ... ... | 4 | — |
| | | 329,611 | 572,988.79 |
| 333,431 | අමු තේ කොළ විකිණීම ... ... ... | 10,869 | 2,412.90 |
| 585 | රබර් කොටසෙහි ආදයම ... ... ... ... | | — |
| 142 | ක්ලෝන කැබෙලි විකිණීම ... ... ... ... | | — |
| | භූමි කුලිය ... ... ... ... ... | | 2.75 |
| 334,158 | | | 575,404.44 |

# ලංකා තේ පර්යේෂණායතනය

## 1965 දෙසැම්බර් 31 වෙනි දිනට අවසන් වන වර්ෂය සඳහා අය වැය ගිණුම

| 1964 රුපි: | | රුපි: ශත |
|---|---|---|
| 565,619 | දෙවු ශ්‍රෙණි වැටුප් | 653,170.15 |
| 215,049 | අන්තර් මධ්‍ය ශ්‍රෙණි වැටුප් | 288,568.08 |
| 419,043 | කණිටු ශ්‍රෙණි වැටුප් | 556,566.82 |
| 175,814 | සුළු සේවක නිලධාරී වැටුප් | 216,189.15 |
| 44,245 | විවිධ වැටුප් | 54,804.11 |
| 119,910 | දිනපතා ගෙවන කම්කරුවෝ | 149,006.87 |
| 247,178 | විද්‍යා, කාර්මික ගබඩාව හා පොදු කාරක වියදම් | 250,435.54 |
| 96,851 | පුස්තකාලය හා ප්‍රකාශන | 82,828.46 |
| 160,051 | පරිපාලනය, ගොඩනැගිලි හා උපකරණ | 152,684.92 |
| 103,280 | නඩත්තු කිරීම් | 119,701.21 |
| 186,879 | පොදු සේවාවන් | 209,047.98 |
| 164,676 | නිලධාරීන්ගේ ගමන් | 209,095.43 |
| 65,744 | විවිධ | 156,025.16 |
| 350,000 | සුළු ඉඩම් හිමි උපදෙස් සේවය (තේ පාලක දෙපාර්තමේන්තුව) | 350,000.00 |
| 61,065 | වතුයා වියදම් කොටස | 71,673.78 |
| 203,263 | පහත රට ස්ථානය—රත්නපුර | 274,379.60 |
| 3,884 | ආයෝජනයන්ගේ ක්ෂය | — |
| 615,089 | ක්ෂය | 864,044.37 |
| 1,097,221 | වියදමට වැඩි ආදයම | 837,439.03 |
| 4,854,861 | | 5,484,660.66 |

| 1964 රුපි: | | රුපි: ශත | රුපි: ශත |
|---|---|---|---|
| | වතුයා කාරක ගිණුමෙහි ශේෂය— | | |
| 252,074 | සාන්ත කුම්බස් | 287,862.03 | |
| 47,955 | සාන්ත ජොයකිම් | 77,381.47 | 365,243.50 |
| 4,556,244 | තේ සෙස් බද්ද | | 4,918,606.80 |
| 94,906 | පොලිය | | 56,301.11 |
| 2,700 | කාඩය හා මස් කඩ කුලිය | | 2,670.00 |
| 30,662 | විවිධ ලැබීම් | | 125,796.70 |
| 6,230 | ක්ලෝන කැබෙලි විකිණීම | | 10,970.35 |
| — | අමු තේ කොළ විකිණීම—පස්සර | | 5,072.20 |
| 4,894,861 | | | 5,484,660.66 |

# ලංකා තේ පර්යේෂණායතනය

## 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ස්ථාවර වත්කම්

| | 64.12.31 දිනට මිළ | 1965 දී එකතු කිරීම් | ගැලපීම: හර | ගැලපීම: බැර | ව්‍යාපහරණය | 65.12.31 ශුද්ධ මිල | 64.12.31 ක්ෂය ප්‍රමාණය | 1965 දී ක්ෂය ප්‍රමාණය: අනුපාතිකය | 1965 දී ක්ෂය ප්‍රමාණය: ප්‍රමාණය | 65.12.31 දිනට සමුච්චිත ක්ෂය | 65.12.31 අඩු කළ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාන්ත කුම්බස් වතුයාය—ඉඩම් . .. .. | 1,338,533.37 | 21,532.47 | — | — | — | 1,360,065.84 | — | — | — | — | 1,360,065.84 |
| සාන්ත ජොයකීම් වතුයාය—ඉඩම් .. .. | 654,481.65 | 24,288.55 | — | — | — | 678,770.20 | — | — | — | — | 678,770.20 |
| ජල සැපයුම—සාන්ත කුම්බස් .. .. .. | 627,328.56 | 4,721.38 | — | — | — | 631,049.94 | 349,472.00 | 10% | 62,732.85 | 412,204.85 | 218,845.09 |
| ජල සැපයුම—සාන්ත ජොයකීම් . .. .. | 23,203.45 | 12,242.01 | — | — | — | 35,445.46 | 3,835.80 | 10% | 2,320.34 | 6,156.14 | 29,289.32 |
| විද්‍යාගාර හා කාර්යාලය—සාන්ත කුම්බස් .. .. | 806,748.18 | 49,094.32 | — | — | — | 855,842.50 | 177,966.67 | 4% | 32,273.92 | 210,240.59 | 645,601.91 |
| විද්‍යාගාර හා කාර්යාලය—සාන්ත ජොයකීම්. . .. | — | — | — | — | — | — | — | — | — | — | — |
| දෙටු නිලධාරි නිවාස—සාන්ත කුම්බස් .. .. | 1,162,988.42 | 9,933.18 | — | — | — | 1,172,921.60 | 281,371.58 | 4% | 46,519.53 | 327,891.11 | 845,030.49 |
| දෙටු නිලධාරි නිවාස—සාන්ත ජොයකීම් .. .. | — | — | — | — | — | — | — | — | — | — | — |
| අන්තර් මධ්‍ය නිලධාරි නිවාස—සාන්ත කුම්බස් .. | 369,624.43 | 19,052.18 | — | — | — | 388,676.61 | 28,831.38 | 4% | 14,784.97 | 43,616.35 | 345,060.26 |
| අන්තර් මධ්‍ය නිලධාරි නිවාස—සාන්ත ජොයකීම් .. | — | — | — | — | — | — | — | — | — | — | — |
| කනිටු නිලධාරි නිවාස—සාන්ත කුම්බස් .. .. | 1,658,810.39 | 81,599.73 | — | — | — | 1,739,410.12 | 227,102.95 | 4% | 66,352.41 | 293,455.36 | 1,445,954.76 |
| කනිටු නිලධාරි නිවාස—සාන්ත ජොයකීම් .. .. | — | — | — | — | — | — | — | — | — | — | — |
| විවිධ ගොඩනැගිලි—සාන්ත කුම්බස් .. .. | 820,639.08 | 41,438.33 | — | — | — | 862,677.41 | 244,964.05 | 4% | 32,825.56 | 277,789.61 | 584,287.80 |
| විවිධ ගොඩනැගිලි—සාන්ත ජොයකීම් .. .. | — | — | — | — | — | — | — | — | — | — | — |
| අමතර ගොඩනැගිලි—සාන්ත කුම්බස් .. .. | 770,694.50 | 675.00 | — | — | — | 771,369.50 | 333,387.76 | 4% | 30,827.78 | 364,275.54 | 407,153.96 |
| නොරිස් අනුස්මරණ ක්‍රීඩා ශාලාව .. .. | 68,080.36 | — | — | — | — | 68,080.36 | 12,890.38 | 4% | 2,723.27 | 15,613.59 | 52,466.77 |
| කර්මාන්ත ශාලාව—සාන්ත කුම්බස් .. .. | 480,749.47 | 14,011.51 | — | — | — | 494,760.98 | 327,599.31 | 4% | 19,229.97 | 346,829.28 | 147,931.70 |
| කර්මාන්ත ශාලාව—සාන්ත ජොයකීම් .. .. | 940,329.44 | 182,283.57 | — | 10,101.84 | — | 1,112,511.17 | 404.07 | 4% | 37,613.17 | 38,017.24 | 2,074,493.93 |
| ගොඩනැගිලි—සාන්ත ජොයකීම් . .. .. | 1,832,534.66 | 416,253,85 | — | — | 15,000.00 | 2,227,788.51 | 36,195.97 | 4% | 73,301.38 | 109,497.35 | 2,118,291.15 |
| හන්තාන අතුරු ස්ථානය .. .. .. | 257,387.13 | 1,367.50 | — | — | — | 258,754.63 | 60,916.82 | 10% | 25,738.71 | 86,655.53 | 172,099.10 |
| පස්සර අතුරු ස්ථානය .. .. .. | 90,974.25 | 20,847.47 | — | — | — | 111,821.72 | 24,344.26 | 10% | 9,097.42 | 33,441.68 | 78,380.04 |
| කොට්ටාව අතුරු ස්ථානය .. .. .. | 128,491.00 | — | — | — | — | 128,491.00 | 33,074.91 | 10% | 12,849.10 | 45,924.01 | 82,566.99 |
| ගෘහ භාණ්ඩ—සාන්ත කුම්බස් .. .. .. | 712,698.73 | 20,317.38 | — | — | — | 732,416.11 | 300,631.58 | 10% | 71,209.87 | 371,241.45 | 361,174.66 |
| ගෘහ භාණ්ඩ—සාන්ත ජොයකීම් . .. .. | 38,498.59 | 12,400.05 | — | — | — | 50,898.64 | 4,339.86 | 10% | 3,849.85 | 8,189.71 | 42,708.93 |
| සවි කළ භාණ්ඩ—සාන්ත කුම්බස් .. .. | 230,060.40 | 4,411.69 | — | — | 1,909.20 | 232,562.89 | 189,073.16 | 10% | 23,006.04 | 212,079.20 | 20,483.69 |
| සවි කළ භාණ්ඩ—සාන්ත ජොයකීම .. .. | 14,665.00 | — | — | — | — | 14,665.00 | 2,459.60 | 10% | 1,466.50 | 3,926.10 | 10,738.90 |
| කාර්යාල උපකරණ—සාන්ත කුම්බස් .. .. | 135,629.83 | 14,686.35 | — | — | — | 149,716.18 | 57,527.02 | 10% | 13,502.98 | 71,030.00 | 78,686.18 |
| කාර්යාල උපකරණ—සාන්ත ජොයකීම් .. .. | 19,246.18 | 670.00 | — | — | — | 19,916.18 | 1,681.55 | 10% | 1,924.61 | 3,606.16 | 16,310.02 |
| විද්‍යාගාර උපකරණ හා යන්ත්‍ර—සාන්ත කුම්බස් .. | 1,052,473.21 | 276,693.01 | 292.50 | — | — | 1,329,458.72 | 496,876,36 | 10% | 105,247.32 | 602,123.68 | 727,335.04 |
| ව්‍යදාගාර උපකරණ හා යන්ත්‍ර—සාන්ත ජොයකීම .. | 9,579.58 | — | 53,000.00 | — | 53,000.00 | 9,579.58 | 1,915.91 | 10% | 957.95 | 2,873.86 | 6,705.72 |
| වතුයා-යන්ත්‍ර—සාන්ත කුම්බස් . . .. .. | 481,237.65 | 34,628.89 | — | — | 1,205,00 | 514,661.54 | 278,683.72 | 10% | 48,123.76 | 326,807.48 | 187,854.06 |
| වතුයා-යන්ත්‍ර—සාන්ත ජොයකීම් .. .. | 634,813.94 | 332,432.30 | — | — | — | 967,246.24 | — | 10% | 63,481.39 | 63,481.39 | 903,764.85 |
| වාහන .. .. .. .. | 441,396.39 | — | — | — | — | 441,396.39 | 261,286.91 | 25% | 62,083.78 | 323,370.69 | 118,025.70 |
| | රු. 15,800,697.84 | 1,587,580.72 | 53,292.50 | 10,101.84 | 71,114.28 | 17,360,365.02 | 3,736,233.58 | | 864,044.37 | 4,600,277.95 | 12,760,077.07 |